# දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# කාර්ය සාධන වාර්තාව - 2013

# ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



සෑම සමාජයකම ඔවුන්ගේ පරිසරය පදනම් කර ගත් වෛද්‍ය ඥානයක් හා වෛද්‍ය ක්‍රමයක් පැවති බවට ඓතිහාසික සාක්ෂි එමට ඇත. එම වෛද්‍ය ක්‍රම අතර, ත්‍රිදෝෂ මත පදනම් වූ දේශීය වෛද්‍ය ක්‍රමයට හිමිවන්නේ ඉතා ඉහල තැනකි. ඉංදු ගංගා මහා තැනිතලාවේ වසර 5000 කට ආසන්න ඉතිහාසයක් පුරා හැදී වැඩී පෝෂණය වූ මෙම වෛද්‍ය ක්‍රමය දකුණු ආසියාව පුරා විහිදුණු සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමයක්ව පැවැතිණ.

පුලතිසි රාවණා පරපුරෙන් පැවැත එන දියුණු වෛද්‍ය ක්‍රමයක් වන මෙය, මෙරට ස්වදේශිකයන් අතර බුදු සමයත්, භික්ෂු සමාජයත් පදනම් කරගෙන ව්‍යාප්ත වූ බව ඉතිහාසයෙන් පෙනේ.

දේශය පුරාම ව්‍යාප්ත වූ සාමාන්‍ය ගැමියන් අතරද, දේශීය වෛද්‍ය ක්‍රමය හා වෛද්‍ය ඥානයක් පැවති බවට රොබොට් නොක්ස් ආදීන්ගේ වාර්තාවලින් පැහැදිලි වේ. එමෙන්ම, වෛද්‍ය ක්‍රම, ජ්‍යෝතිෂ, ශාන්ති කර්ම යන අංගයන්ගේ සමූහිකත්වයකින්ද, සුවිශාල බෙහෙත් නිඝණ්ඩුවකින්ද, සොබා දහම් පිළිබඳ ගැඹුරු විශ්වාසයකින්ද මෙම ක්‍රමය පැවැතිණ.

යටත්විජිතකරණයත් සමග අපේ පාරම්පරික වෙදකම පරිහානියටත්, නොසැලකිල්ලටත් භාජනය විය. වෙදකම ගොඩේ වෙදකම ලෙසත්, වෛද්‍යවරයා ගොඩේ වෙදා ලෙසත්, හැඳින්විය. ජාතිකත්වය හා දේශීයත්වය ගර්හා කටයුතු නොවැදගත් දෙයක් බවට පත්විය.

1948 දී අප නිදහස ලැබුව ද ජාතික ප්‍රබෝධයකින් නැගී සිටීමට අවස්ථාව ලැබුනේ 1956 ජයග්‍රහණයත් සමගයි. වෛද්‍ය ඥානය විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා වර්ධනය වී ඇත. ප්‍රවීන වෘත්තිකයන් හා වෘත්තිය සංවිධාන වලින් ද ඖෂධ නිෂ්පාදනගාර වලින් ද සමන්විත මෙය කැබිනට් අමාත්‍යාංශයක් දක්වා වූ ජාතික පිළිගැනීමකට ද ලක්ව ඇත. ආයුර්වේදය, ලංකායුර්වේදය නොහොත් පාරම්පරික වෙදකම, සිද්ධ, යුනානි, හොමියෝපති ආදි වෛද්‍ය ක්‍රම රාශියකින් සමන්විතය.

එළඹෙන දශකයේ ප්‍රජාව පීඩාවට පත්කරණ බරපතල සෞඛ්‍ය ගැටළුව, බෝනොවන රෝග බව තහවුරු වී ඇත. ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග ව්‍යාප්තිය බෝවන රෝග ඉක්මවා ඇත. එම රෝග වැලැක්වීමේ හා ප්‍රතිකාර කිරීමේ ප්‍රශස්ත ක්‍රියාමාර්ගය එහි හේතුකාරක ඉවත් කිරීමයි. එහි ප්‍රවේශය මහජනතාව සුවපත් කරවන කාබනික කෘෂිකර්මය මත පදනම් වූ නිර්විෂ පෝෂණය හා පරිසර හිතකාමී සරල ජීවන රටාවත්, ඊට අදාල, උපක්‍රමික ක්‍රමවේද හා මෘදු මෙවලම් දේශීය හා පාරම්පරික වෛද්‍ය ක්‍රමය සතු අනන්‍ය සම්පතකි. දේශීය වෛද්‍ය ක්‍රමය, අපේ මාතෘ භූමිය ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමේ මහින්ද චින්තනය යථාර්තයක් කලහැකි සුවිශේෂ පැති කඩකි.

නිරෝගී ජනතාවක් හා නිරෝගී ශ්‍රම බලකායක් තුලින් දේශයේ සෞඛ්‍ය සංරක්ෂණයේ පෙරගමන්කරුවා ලෙස, අධිරාජ්‍යවාදීන් විසින් නොසලකා හරින ලද, අදද ඇතැම් පිරිස්වල ගැරහීමට ලක්වන දේශීය වෙදකම හා දේශීය වෛද්‍යවරයා, සමාජය තුල පිළිගැනීමක් සහිත ගෞරවනීය වෘත්තියක් හා වෘත්තිකයකු බවට පත්කිරීමට ප්‍රයත්න දැරීම දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ඒකායන පරමාර්ථයයි.

**සාලින්ද දිසානායක**
දේශීය වෛද්‍ය අමාත්‍ය

# ගරු දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දීර්ඝායුෂ පිලිබඳ ඉගැන්වෙන නිරෝගී දිවි පැවැත්මට ඉවහල් වන අධ්‍යාපනය අප ලබා ගන්නේ දේශීය වෛද්‍ය විද්‍යාවෙන් බව අපට නොරහසකි. ඈත අතීතයේ අප මුතුන් මිත්තන් තම ජීවනෝපාය ලෙස යොදාගත්තේ ගොවිතැනයි. තමනට එදිනෙදා අවශ්‍ය එළවළු, පළතුරු හා ධාන්‍ය ආදී සෑම දෙයක්ම තම ගෙවත්තේම වගාකර කෘත්‍රිම පොහොර වර්ග නොයෙදූ වස විස නොමැති ආහාර රටාවකට අප පැරැන්නන් හුරුවී තිබිණි. එදා අපේ මුතුන් මිත්තන් නිරෝගී සෞඛ්‍ය සම්පන්න දීර්ඝායුෂ ලැබූ අයයි. ආරෝග්‍යා පරමා ලාභා යන බුදු වදනින්ද මෙය මොනවට පැහැදිලි වේ. ඈත අතීතයේ මෙවන් ජීවන රටාවකට හුරුවූ පැරැන්නන් යෝධ බල ඇති ශක්තිමත් ජවයකින් යුත් දසමහ යෝධයින් දුටුගැමුණු ආදී රජවරුන් කල නිර්මාණයන්ගෙන් මනාව පැහැදිලි වේ. තවද ඈත අතීතයේ රාවණා යුගය දෙස බලන කල අපටම ආවේණික වූ දේශීය වෛද්‍ය ක්‍රමයක් අපට තිබූ බවට සාක්ෂි ගෙනදේ. දේශීය වෛද්‍ය ක්‍රමය ඉන්දියාවට උරුම වූ දෙයක් වුවද එය අපේ රටටද සැබැවටම ආවේණික වූවකි.

අද තාක්ෂණයේ දියුණුව සමඟම අප රට වැසියාද කෘත්‍රිම රසායනික ආහාර පාන වලට ඇබ්බැහි වීම හේතුවෙන් විවිධ රෝග වලට ගොදුරු වී ඇත. උදාහරණ ලෙස ගතහොත් සීඝ්‍රයෙන් පැතිර යන වකුගඩු රෝගය, වකුගඩුවේ ගල් ඇතිවීම ආදී රෝග පැතිරෙමින් පවතින අතර, ඒවාට ප්‍රතිකර්ම විධි පිලිබඳව වැඩමුළු මේ වන විටත් දියත් කරමින් පවතී. එමෙන්ම දියවැඩියාව හා අධික රුධිර පීඩනයද නූතන සමාජයේ ගහණ වූ රෝගයන්ය. ඒවාට ප්‍රතිකර්ම දේශීය වෛද්‍ය විද්‍යාවෙන් සොයාගෙන ඇත. අද අප ආයුර්වේද සායන වලට පැමිණෙන රෝගීන් සුවය ලබන අයුරු දැකීමෙන් මෙය සනාථ වනවා ඇත. බොහෝවිට දේශීය ශාක වර්ගයන් හා ඒවායේ කොටස් භාවිතා කරමින් අප නිපදවා ගනු ලබන බෙහෙත් වර්ග නියමිත ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනය වන බව තවදුරටත් කිව යුතුය.

දශක තුනක කාලයක් තිස්සේ අප රට තුල පැවති කුරිරු යුද්ධය නිමා කර භීෂණය තුරන් කල අතිගරු ජනාධිපතිතුමන්ගේ මහින්ද චින්තන ප්‍රතිපත්තියට සමගාමී ලෙසින් දියත් වන සංවර්ධන වැඩපිළිවෙලවල් ලෝකයට නොරහසකි. ඒ අනුව, දේශීය වෛද්‍ය ක්‍රමය ජාත්‍යන්තරය දක්වා ගෙන යමින් ජපානය, චීනය වැනි විදේශ රටවල පවා පංචකර්ම හා ආයුර්වේද මධ්‍යස්ථාන පිහිටුවීමට මා මෑතකදී ගත් ප්‍රයත්නය අතිසාර්ථක වූ අතර, අප දේශීය වෛද්‍යවරුනටද රැකියා අවස්ථාවන් උත්පාදනය කිරීමේ අවස්ථාව එලඹීන. එය අප ලද මහත් වරප්‍රසාදයකි. මේ සෑම කටයුත්තකම පිටුපස සෙවනැල්ලක් ලෙස සිටින මහින්ද චින්තන වැඩපිලිවලේ පුරෝගාමියා වූ අප අතිගරු මහින්ද රාජපක්ෂ ජනපතිඳුන්ට කෘතඥ වෙමු.

**පණ්ඩු බණ්ඩාරනායක**
දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය

# දේශීය වෛද්‍ය ලේකම්තුමාගේ පණිවිඩය



රාවණා පුලතිසි පරපුරෙන් පැවත එන පාරම්පරික හෙළ වෙද ක්‍රමය අතීතයේ සිට අද දක්වාත් ශ්‍රී ලංකාවාසීන්ගේ නිරෝගී බව සුරැකීමට මහත් දායකත්වයක් සපයා ඇත. හෙළ වෙද ක්‍රමය, උතුරු ඉන්දියාවෙන් ලැබුණු ආයුර්වේදයෙනුත්, දකුණු ඉන්දියාවෙන් ලැබුණු සිද්ධ වෙදකමිනුත්, අරාබිකරයෙන් ලැබුණු යුනානි වෙදකමිනුත් පෝෂිතව නිරන්තරයෙන් දියුණුවෙමින් පවතී. බටහිර වෛද්‍ය ක්‍රමය හැර අනිකුත් සියළු වෛද්‍ය ක්‍රම තුළින් මනා සේවාවක් සැපයීම මඟින් නිරෝගී ජනතාවක් බිහිකිරීමේ අරමුණ ඇතිව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය බිහිකර ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව යමින් දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීමත්, පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීමත්, රටට අවශ්‍ය දේශීය ඖෂධ අප රටෙහිම නිපදවා ගැනීමට ඔසු වගාව වැඩි දියුණු කිරීමත්, බටහිර වෛද්‍ය ක්‍රමය හැරුණු විට අනෙකුත් වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය කිරීමත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මූලික අරමුණු වේ.

එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, ආයුර්වේද පර්යේෂණායතනය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, ආයුර්වේද වෛද්‍ය සභාව සහ හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවා ඇත. අමාත්‍යාංශය, මෙම ආයතන යටතේ දේශීය වෛද්‍ය ක්‍රම සහ විකල්ප වෛද්‍ය ක්‍රම මඟින් රෝගී සත්කාරක සේවා මෙන්ම රෝග නිවාරණ සේවා ක්‍රියාත්මක කරයි. ඊට අමතරව දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය උදෙසා දැනුවත් කිරීම්, විවිධ රෝග සඳහා අවශ්‍ය ප්‍රතිකාර පිළිබඳ පර්යේෂණ පැවැත්වීම්, ඔසු වගා ව්‍යාපෘති, ඖෂධ වගා ප්‍රවර්ධනය කිරීම් වැනි විවිධ කාර්යයන්හී නිරත වේ.

පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම රැකගැනීමටත්, එය අනාගත පරපුරට දායාද කිරීමත්, වඩාත් ගුණවත් සුව සේවාවක් උදෙසා ඔසු භාවිතය හා ප්‍රතිඵල පිළිබඳ නව පර්යේෂණ, සමීක්ෂණ දිරිමත් කිරීමත්, ජාත්‍යන්තර ප්‍රමිතිකරණ ක්‍රමවේදය අනුව හෙළ ඔසු ජාත්‍යන්තරව ව්‍යාප්ත කිරීමටත් අමාත්‍යාංශය දැනටමත් කටයුතු කර ඇති අතර, අනාගතයේ දී ඒවා තවදුරටත් ශක්තිමත් කිරීමට නව ව්‍යාපෘති සකස් කිරීමට අපේක්ෂිතය.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන ඒකාබද්ධව දේශීය වෛද්‍ය ක්‍රමයේ සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ අභිවෘද්ධිය උදෙසා අතිමහත් කැපකිරීමක් කරන අතර, 2014 වර්ෂයේ එය වඩාත් සාර්ථක වේවායි පතමි.

**ලලිත් කන්නන්ගර**
දේශීය වෛද්‍ය ලේකම්

# පෙල ගැස්ම


| | දැක්ම | පිටුව |
|---|---|---|
| | මෙහෙවර | |
| 1. | හැඳින්වීම | 01 |
| 2. | අමාත්‍යාංශයේ ප්‍රමුඛතා | 03 |
| 3. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතන | 05 |
| 4. | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල වියදම් සාරාංශය- 2013 | 06 |
| 5. | අමාත්‍යාංශය යටතේ සෘජුව ක්‍රියාත්මක වන ව්‍යාපෘති/ වැඩසටහන් හා ප්‍රගතිය | 07 |
| 6. | අන්තර් අමාත්‍යාංශ සහයෝගීතා වැඩසටහන් | 10 |
| 7. | අමාත්‍යාංශ තොරතුරු තාක්ෂණ පිවිසුම | 15 |
| 8. | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා ව්‍යාපෘති/ වැඩසටහන් වල ප්‍රගතිය - 2013 | 15 |
| | 8.1 ආයුර්වේද දෙපාර්තමේන්තුව | 16 |
| | 8.2 ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 38 |
| | 8.3 හෝමියෝපති රෝහල/ වෛද්‍ය සභාව | 40 |


දැක්ම
හෙල වෙදකමින් සැමට සුවසෙත
මෙහෙවර
ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින්
පර්යේෂණ සහ
නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින්
සමස්ත ප්‍රජාවට
සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය
කිරීම තුලින් ඔවුන් ජාතික ආර්ථික
හා සහස්‍ර සංවර්ධන ඉලක්කයන්සපුරා ගැනීම
සඳහා ප්‍රබල අයුරින් දායක කරවීම.

# 01. හැඳින්වීම

**"ලොවටම ආඩම්බරයෙන් දායාද කළ හැකි මහඟු දේශීය වෛද්‍ය ක්‍රමයක් අප සතුව ඇත. එම දැනුම සංරක්ෂණය කිරීමත් ලොවටම බෙදා හැරීමත් ඉතිහාසය විසින් මට පැවරුන වගකීමක් ලෙස මම දකිමි"**

**(මහින්ද චින්තන 2005 – 62 පිටුව)**

දේශීය වෙදකමේ ඉතිහාසය සිංහල ජාතියේ ආරම්භය තරම්ම ඈතට දිව යන්නකි. එමෙන්ම මෙය, ශ්‍රී ලංකාවේ පාරම්පරික වෛද්‍ය ක්‍රමයක් වන අතර, සම්ප්‍රදායික දැනුම මත පදනම් වූවකි. මෙසේ පැවත ආ දේශීය වෙදකමට උතුරු ඉන්දියාවෙන් ලැබුණු ආයුර්වේදයත්, දකුණු ඉන්දියාවෙන් ලැබුණු සිද්ධ වෛද්‍ය ක්‍රමය හා අරාබිකරයේ යුනානි වෛද්‍ය ක්‍රමයත් සම්මිශ්‍රණය වී දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ වැඩිදියුණුව සිදුවී ඇත.

ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති අවධියේ දේශීය වෛද්‍ය ක්‍රමය යටපත් වී තිබූ අතර, ජාතික සෞඛ්‍ය ක්‍රමයක් ලෙස බටහිර වෛද්‍ය ක්‍රමය දේශය පුරා ව්‍යාප්ත විය.

නමුදු දේශීය වෛද්‍ය ක්‍රමයේ පවත්නා වූ ගුණාත්මක බව හඳුනාගත් රජයන්, එය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියා කළ අතර වෙනම දෙපාර්තමේන්තුවක්, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පිහිටුවමින් මෙහි පැවැත්ම තහවුරු කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ලෙස නම් කළ අතර, 1980 වසරේදී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙනම අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කරන ලදී. වර්තමානයේ මෙය කැබිනට් ඇමතිවරයකුගේ හා නියෝජ්‍ය ඇමතිවරයකුගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම හෙළ වෙදකමේ උන්නතියට බලපාන කරුණකි. දේශීය වෙදකම තුළින් දේශයේ සංවර්ධනයට දායක කර ගත හැකි සෞඛ්‍ය සම්පන්න හා සමෘද්ධිමත් ජාතියක් බිහි කිරීම උදෙසා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සුවිශේෂී කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.

මේ වන විට ලංකාව පුරා දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිතව පවතින අතර, බොහෝ දෙනා වැඩි වශයෙන් මෙම ප්‍රතිකාර ක්‍රමයට නැඹුරු වන බවක්ද දක්නට ලැබේ. එසේම ගුණාත්මක ඖෂධ නිෂ්පාදනය තුළින් අන් රට වලද දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීමට ලැබීම අප ලැබූ ජයග්‍රහණයකි. දේශීය වෛද්‍ය ක්‍රම ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම තුළින් පහත ක්‍රියාමාර්ග ගනිමින් ජනතාවට සෙත සැලසීම අමාත්‍යාංශයේ ප්‍රමුඛ අපේක්ෂාව වේ.

1. දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
2. සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩ නැගීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය භාවිතා කිරීම.
3. දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම.
4. දේශීය ඔසු වගාව පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් ඖෂධ නිෂ්පාදනය ඉහළ දැමීම.
5. සුරක්ෂිත ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර එය සංවර්ධනයට දායක කර ගැනීම.
6. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රවර්ධනයක් ඇති කිරීම.

ඉහත අභිමථාර්තයන් සාක්ෂාත් කරවීම උදෙසා, මේ වන විට දිවයින පුරා ආයුර්වේද රෝහල් 86 ක් හා මධ්‍යම බෙහෙත් ශාලා 283 ක් පිහිටුවා ඇති අතර ඒවායින් වසරකට රෝගීන් මිලියන 4 ක් පමණද, නේවාසිකව රෝගීන් 75,000 ක් පමණද ප්‍රතිකාර ගනු ලබයි. ආයුර්වේද වෛද්‍යවරුන් 1,176 ක් පමණ දැනට රාජ්‍ය සේවයේ යොදවා ඇත. පළාත් පාලන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා මඟින්ද රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන අතර ඒවායේ පාලනය පළාත් පාලන ආයතන සතු වුවත් බෙහෙත් ලබා දීමේ වගකීම පැවරී තිබෙනුයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට හා ආයුර්වේද දෙපාර්තමේන්තුවටය. මේ වන විට විශාල රෝගීන් සංඛ්‍යාවක් රජයේ නිදහස් ආයුර්වේද සේවා ලබාගන්නා අතර, තවත් සැලකිය යුතු රෝගීන් සංඛ්‍යාවක් පෞද්ගලික ආයුර්වේද රෝහල් සහ බෙහෙත්ශාලා වලිනුත්, පාරම්පරික වෛද්‍යවරුන් වෙතිනුත් ප්‍රතිකාර ලබාගනී.

එමෙන්ම සේවා දායකයින්ට ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා අමාත්‍යාංශය යටතේ පහත සඳහන් ආයතන ක්‍රියාත්මක වේ.


1. ආයුර්වේද දෙපාර්තමේන්තුව
2. ආයුර්වේද වෛද්‍ය සභාව
3. බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය
4. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය
5. ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා
6. ඔසු උයන්
7. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
8. හෝමියෝපති වෛද්‍ය සභාව
9. වැලිසර හොමියෝපති රෝහල සහ සායන
10. ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාලය-අනුරාධපුරය

# 02. අමාත්‍යාංශ ප්‍රමුඛතා

| විශේෂ අවධානයට ලක්වූ ප්‍රමුඛතා අංශ | ප්‍රතිඵල නිමැවුම් දර්ශකය |
|---|---|
| 1. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ නීතිමය රාමුව සවිමත් කිරීම | ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතයේ අක්‍රමිකතා අවම වීම.<br>වෘත්තීමය වශයෙන් තෘප්තිමත් ආයුර්වේද වෛද්‍යවරුන් බිහිවීම.<br>ආයුර්වේද ප්‍රතිකාර ආයතන නීතිමය පදනමක් මත ශක්තිමත් කිරීම. |
| 2. ආයුර්වේද පර්යේෂණ ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරිම | ගුණාත්මක භාවයෙන් යුත් නව ආයුර්වේද නිෂ්පාදනවල ප්‍රමාණාත්මක වැඩි වීම.<br>ආයුර්වේද පර්යේෂකයින්ගේ අයිතීන් තහවුරු වීම.<br>ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධ පිළිගැනීම පුළුල් වීම.<br>ආයුර්වේද පර්යේෂණ හා පර්යේෂකයින් සඳහා වැඩි අවස්ථාවන් සැළසීම.<br>බෝ නොවන රෝග පාලනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රම හඳුන්වා දීම.<br>සංරක්ෂණය වූ පාරම්පරික ආයුර්වේද ලේඛණ ප්‍රමාණය ඉහළ යාම.<br>ආයුර්වේදයට සම්බන්ධ බුද්ධිමය දේපල අයිතීන් සුරක්ෂිත වීම හා විධිමත් වීම. |
| 3. ආයුර්වේදය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම. | යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් නිර්මාණය වීම.<br>ක්‍රමවත් ජාලගත මෙහෙයුම් පද්ධතියක් නිර්මාණය වීම.<br>ඊ-ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් නිර්මාණය වීම.<br>දේශීය වෙදකමේ නිම් වලලු පුළුල් වීම . |
| 4. ආයුර්වේද සෞඛ්‍ය සංරක්ෂණය යාවත්කාලීන හා වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය | ගුණාත්මක භාවයෙන් යුත් මානව සම්පත ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>වෘත්තීමය වශයෙන් තෘප්තිමත් මානව සම්පත වැඩි වීම.<br>දේශීය වෛද්‍ය ක්‍රම සඳහා ඇති ගෝලීය ඉල්ලුම සැපිරිය හැකි වීම.<br>පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම හා කුසලතාවය නූතන සමාජ අවශ්‍යතාවය උදෙසා යාවත්කාලීන වීම.<br>නිපුණතාවයෙන් යුත් දේශීය වෛද්‍යවරු ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතාකරන්නන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩිදියුණු වී තිබීම. |

| | |
|---|---|
| 5.ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ඖෂධීය පැළෑටි වගා කිරීම, වැඩිදියුණු කිරීම සහ ඔසු උයන් ආරම්භ කිරීම | ඉහළ ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක ඖෂධ ප්‍රමාණය වැඩිවීම.<br><br>ආයුර්වේදය තුළින් ආදායම් උත්පාදනය ඉහළ යාම.<br><br>ආයුර්වේද ඖෂධ සඳහා ඇති විදේශීය වෙළඳ පොළ අවස්ථා ඉහළ යාම.<br><br>භාවිතයට පහසු ඖෂධ නිෂ්පාදනය ඉහළ යාම. |
| 6. ආයුර්වේදය වාණිජකරණය අනුව පවත්වාගෙන යාම. | පාරම්පරික වෙදකම, ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය ක්‍රම ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත වීම.<br><br>විශේෂිත වූ ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සැපයීමට හැකිවන පරිදි නවීන පහසුකම් සහිත රෝහල් ඇති වීම.<br><br>පවතින ඔසු උයන් හා නව ඔසු උයන් උසස් තත්වයට පත් වීම. |
| 7. හෝමියෝපති වෛද්‍ය ක්‍රම භාවිතය ඉහළ නැංවීම. | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ආශ්‍රිත ආයතන විධිමත් ලෙස ස්ථාපිත වීම.<br><br>වෘත්තීමය වශයෙන් තෘප්තිමත් හෝමියෝපති මානව සම්පතක් ඇති වීම. |

## 03. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන



# 04. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල වියදම් සාරාංශය- 2013

| | 2013 වර්ෂයේ ප්‍රතිපාදන (රු. 000') | 2013 වර්ෂයේ වියදම (රු. 000') | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| **දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයතන** | | | |
| පුනරාවර්තන | **227,665.00** | **159,921.04** | **70.2** |
| සාමාන්‍ය පරිපාලනය/ වෙනත් වැඩසටහන් | 130,165.00 | 100,047.25 | 76.8 |
| ආයතන සේවා<br>• හෝමියෝපති වෛද්‍ය සභාව/ රෝහල | 27,500.00 | 15,929.68 | 57.9 |
| විශේෂ වැඩසටහන්<br>• ආයුර්වේද ඖෂධ<br>• පෝෂණ වැඩසටහන | 65,000.00<br>5,000.00 | 42,623.14<br>1,320.97 | 65.5<br>26.4 |
| ප්‍රාග්ධන | **246,265.00** | **147,601.20** | **59.9** |
| සාමාන්‍ය පරිපාලනය | 67,265.00 | 30,352.06 | 45.1 |
| විශේෂ වැඩසටහන්<br>• ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන<br>• ඖෂධ සංස්ථාවේ ඉදිකිරීම<br>• සංරක්ෂණ සභා<br>• තරුණ ඔසුගොවි ගම්මාන වැඩසටහන<br>• හෝමියෝපති වෛද්‍ය සභාව/ ක්‍රම සංවර්ධනය<br>• පෝෂණ මන්දිර | 105,000.00<br>25,000.00<br>7,000.00<br>1,000.00<br>38,000.00<br>3,000.00 | 87,443.68<br>3,000.00<br>1,991.89<br>301.64<br>22,092.78<br>2,419.15 | 83.3<br>12.0<br>28.5<br>30.2<br>58.1<br>80.6 |
| **එකතුව** | **473,930.00** | **307,522.24** | **64.89** |

## ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යයන් අනුව වියදම් සාරාංශය -2013

| | 2013 වර්ෂයේ ප්‍රතිපාදන (රු. 000') | 2013 වර්ෂයේ වියදම (රු. 000') | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්තන | **721,250.00** | **636,568.74** | **88.23** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 89,863.00 | 75,550.29 | 84.1 |
| 2. රෝග නිවාරණ සේවා | 423,620.00 | 385,871.18 | 91.1 |
| 3. පර්යේෂණ | 120,697.00 | 102,015.67 | 84.5 |
| 4. අධ්‍යාපන හා පරිපාලන | 38,390.00 | 29,630.48 | 77.2 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාපතිය | 48,680.00 | 43,501.13 | 89.4 |
| ප්‍රාග්ධන | **575,720.00** | **124,753.30** | **21.67** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 11,220.00 | 7,743.30 | 69.0 |
| 2. රෝග නිවාරණ සේවා | 158,500.00 | 37,189.01 | 23.5 |
| 3. පර්යේෂණ | 362,200.00 | 52,095.20 | 14.4 |
| 4. අධ්‍යාපන හා පරිපාලන | 11,300.00 | 3,430.79 | 30.4 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාපතිය | 32,500.00 | 24,295.08 | 74.8 |
| **එකතුව** | **1,296,970.00** | **761,322.14** | **58.7** |

| | | | |
|---|---|---|---|
| මුළු එකතුව | **1,770,900.00** | **1,068,844.38** | **60.36** |

# 05. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති/ වැඩසටහන් හා ප්‍රගතිය

## 5.1 අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසිදෙකක නියමු ව්‍යාපෘතියක් ලෙස, 2001 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ මේ දක්වා ක්‍රියාත්මක වන රෝග නිවාරණ වැඩසටහනකි.

මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ජනතාව දැනුවත් කිරීම මඟින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය වැඩි දියුණු කිරීම හා ඒ තුළින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ දැමීමයි. ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය රජරට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ පර්යේෂණාත්මක අධ්‍යයනයක යෙදීම සඳහා වසර 03ක සැලැස්මක් සකස් කර ඇත. විශ්ව විද්‍යාල පාඨමාලා වලටද සහභාගී වීමට අවස්ථාව හිමිකර දී ඇති ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ ප්‍රජා සෞඛ්‍ය සහකාරවරුන්හට, මෙම පුහුණු පාඨමාලා මඟින් විධිමත් පුහුණුවක් ලබා දී ප්‍රජා සෞඛ්‍ය කටයුතු වැඩි දියුණු කිරීමට ඉඩ සලසා ඇත.



**අනුරාධපුරය ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන - පුහුණු පාඨමාලා පැවැත්වීම**

| | | | | |
|---|---|---|---|---|
| අනුරාධපුර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය | | | | |
| 2013 - ප්‍රගති සාරාංශය | | | | |
| | | | | |
| | වැඩසටහන | වැඩසටහන් විස්තරය | පැවැත් වූ වැඩසටහන් | ප්‍රතිලාභීන් |
| 1 | ආරක්ෂිත ජලය පරිහරණය කරමු | ජල පෝෂක සුරකීමේ වැඩසටහන් | 36 | |
| | | විශ්ලේෂණය කල ජල සාම්පල සංඛ්‍යාව | | 953 |
| 2 | දේශීය ආහාර ප්‍රචලිත කිරීම"හෙළ අහරින් සුවය රකිමු" | ප්‍රායෝගික /දැනුවත් කිරිමේ වැඩසටහන් | 2150 | 15985 |
| 3 | ළමා සෞඛ්‍ය සංරක්ෂණය | ළමා ස්වස්ථතා ප්‍රවර්ධන/සායන | 1635 | 9764 |
| 4 | බෝ නොවන රෝග පාලන වැඩසටහන | ජංගම වෛද්‍ය සායන | 1211 | 38578 |
| | | "සුරකිමු වකුගඩු දුරලමු දියවැඩියාව" | 617 | 12850 |
| | | "වෘත්තීය සෞඛ්‍යයි ආයුර්වේදයයි" | 143 | 3462 |
| | | කාබනික ගෙවතු වගා වැඩසටහන | 374 | 3969 |
| | | සාම්ප්‍රදායික වී වගාවට නැඹුරු කල ගොවීන් | | 807 |
| | | ගෘහ ඒකක දැනුවත් කිරිම | | 38463 |
| 5 | බෝ වන රෝග පාලනය | දැනුවත් කිරිම්/සම්මන්ත්‍රණ සංඛ්‍යාව | 1292 | 9741 |
| 6 | මාතෘ සංරක්ෂණය"ගැබිණි මව දැයේ සම්පතයි" | මාතෘ සායන | 73 | 711 |
| 7 | පාසල් වැඩසටහන් | සරෝදිනි වැඩසටහන් | 25 | 851 |
| | | වසර ශිෂ්‍යත්ව උපකාරක වැඩසටහන් | 113 | 5402 |
| | | ආයුර්වේදීය මුඛ සෞඛ්‍ය වැඩසටහන් | 479 | 3245 |
| | | යෝග හා විහරණ වැඩසටහන් | 6 | 191 |
| 8 | වැඩිහිටි සත්කාරක සේවාව | ගෘහස්ථ ඖෂධ මංජුසා වැඩසටහන් | 255 | 697 |
| | | සායන සංඛ්‍යාව | 50 | 1821 |
| 9 | ප්‍රජා සත්කාරක සේවා | පොලිස්/රණවිරු සත්කාරක සේවා | 9 | 752 |
| | | අභිමංසල ආබාධිත රණවිරු සත්කාරක සේවා | 1 | 193 |
| | | 3ප්‍රාදේශීය ජංගම සේවා | 76 | 2998 |
| | | හදිසි ආපදා කළමනාකරණ වැඩසටහන් | 24 | 303 |
| | | වෙනත් වැඩසටහන් | 841 | 6394 |
| 10 | ඖෂධ පැලෑටි සංරක්ෂණය හා තිරසාර භාවිතය | ඔසු උයන් වැඩසටහන් - රාජ්‍ය ආයතන/පාසැල් | 185 | |
| | | රෝපිත/බෙදා හරින ලද ඖෂධ පැල ගණන | 82 | 2937 |
| | | ආදර්ශ පැල තවාන් | | 82 |
| 11 | රජරට වෛද්‍ය පීඨය - පර්යේෂණ වැඩසටහන | වැඩිහිටි සත්කාර සේවා වැඩසටහන් | 227 | 500 |
| | | | | |

## 5.2 පෝෂණ මන්දිර වැඩසටහන

දේශීය වෛද්‍ය ක්‍රමය උපයෝගී කර ගෙන ජනතාවගේ පෝෂණ තත්වයන් වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මටටමින් පෝෂණ මන්දිර ඉදි කිරීම හා කොළ කැඳ කරත්ත බෙදා දීම මේ මඟින් සිදු කෙරේ. මේ වන විට පන්විල, පල්ලෙකැලේ, මැදවච්චිය, ගහ ඉහල කෝරලේ හා කොලොන්න

යන ප්‍රදේශවල පෝෂණ මන්දිර 05ක් ඉදි කර ඇති අතර බොරැල්ල ආයුර්වේද රෝහල් සංකීර්ණයේ නවතම පෝෂණ මන්දිරයක් ඉදි වෙමින් පවතී. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය නඟා සිටුවා දේශීය ආහාර, ඔසුපැන් සහ කොළකැඳ ජනතාව අතර ජනප්‍රිය කරවමින් ආයුර්වේද චර්යාවන්ට ජනතාව හුරු කරවීම සඳහා නිරෝගිමත් පුරවැසියන් පිරිසක් බිහිකිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන, අම්පාර දැයට කිරුළ භූමියේදී කොළ කැඳ කරත්ත පහක් බෙදා දී ඇත. තවද, නාගදීප පුරාණ රජමහා විහාරාධිපති උතුරු පළාතේ ප්‍රධාන සංඝනායක, පූජ්‍ය නවදගල පදුමකිත්තිතිස්ස නායක ස්වාමීන් වහන්සේගේ සම්බන්ධීකරණයෙන් සහ නාවික හමුදාවේ සහයෝගයෙන්, නයිනතිවු දූපතේ පෝෂණ මන්දිරයක් හා ආයුර්වේද බෙහෙත් ශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 2.5ක ප්‍රතිපාදන ලබා දී ඇත. 2013.06.11 වන දින මෙම පෝෂණ මන්දිරයේ විවෘත කිරීම උත්කර්ෂවත්ව පැවැත්විණි.



යාපනය, නයිනතිවු දූපතේ පෝෂණ මන්දිරය විවෘත කිරීම



අම්පාර දැයට කිරුළ භූමියේදී කොළ කැඳ කරත්ත බෙදා දීම

## 5.3 දේශීය ආහාර රටාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන.

රාජ්‍ය, සංස්ථා හා පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා දිවයින පුරා දේශීය ආහාර ප්‍රවර්ධන හා ආයුර්වේද ජීවන දර්ශනය හඳුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ඒ අනුව 2013-06-25 දින බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් දේශීය ආහාර රටාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වූ අතර මේ සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන් 200කට අධික පිරිසක් සහභාගී විය. මීට අමතරව 2013 - ජුනි මාසය ජාතික පෝෂණ මාසය ලෙස නම් කිරීම පාදක කොට "නිසි පෝෂණයෙන් - සුවැති දිවියක්" තේමාව මුල් කරගනිමින් තවත් පෝෂණ වැඩසටහන් කීපයක් දීප ව්‍යාප්තව පවත්වන ලදී. ඒ අනුව, කොළඹ දිස්ත්‍රික් වැඩමුළුව, නාවින්න බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතන ශ්‍රවණාගාරයේදී 2013-10-29 දින පැවති අතර එම වැඩසටහන සඳහා ආයතන මට්ටමින් රාජ්‍ය සේවක හා පෞද්ගලික අංශයේ නිලධාරීන් සහ මාධ්‍ය නිලධාරීන් 200කට ආසන්න පිරිසක් සහභාගී විය.

## 5.4 හිස තෙල් ගෑමේ රාජ්‍ය උත්සවය

සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට සමගාමීව පවත්වනු ලබන හිස තෙල් ගෑමේ රාජ්‍ය මහෝත්සවය, සෑම වර්ෂයක් පාසාම දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබයි. මෙවර මෙම උත්සවය 2013 අප්‍රේල් 15 දින පෙ.ව. 6.41 සුභ නැකතින්,

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, කතරගම කිරි වෙහෙර රජමහා විහාරාධිපති රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන සංඝනායක, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ කුලපති, උපාධ්‍යාය, ආචාර්ය අලුත්වැව සෝරත හිමිපාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් මහා සංඝරත්නයේ ආශිර්වාදය මැද කතරගම කිරි වෙහෙර රජමහා විහාරස්ථාන පරිශ්‍රයේ කිරිවෙහෙර චෛත්‍ය රාජයාණන් අභියස මහසෙන් දේවමන්දිරය අසලදී  පවත්වනු ලැබීය. සුභ මොහොතින් ආරම්භ වී හෝරාවක පමණ කාලයක් පුරා මෙම ජාතික මහෝත්සවය සියළුම රූපවාහනී නාලිකා ඔස්සේද විකාශනය කරන ලදී. මෙම රාජ්‍ය මහෝත්සවයට සමගාමීව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ආයුර්වේද සමීක්ෂාව සඟරාව එළිදැක්වීම හා 2013 – 2014 ආයුර්වේද ලිත හා ආයුර්වේද අත්පොත සකස් කිරීම සිදු කරන ලදී.





කතරගම කිරිවෙහෙරේ පැවති හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය

### 5.5 සංරක්ෂණ සභා

පාරම්පරික වෛද්‍යවරුන් දිරිමත් කිරීම සඳහා සහ ඔවුන්ගේ ජීවන තත්වය නඟාසිටුවීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 1 බැගින් සංරක්ෂණ සභා පිහිටුවා ඇත. 2013 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සංරක්ෂණ සභා 14කට ඖෂධ කුඩු කිරීමේ යන්ත්‍ර හා තෙල් සිඳීමේ යන්ත්‍ර 07 බැගින් ප්‍රධානය කර ඇත.

# 06. අන්තර් අමාත්‍යාංශ සහයෝගීතා වැඩසටහන්

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තවත් අමාත්‍යාංශ ගණනාවක් සමඟ ඒකාබද්ධව වැඩසටහන් ගණනාවක් 2013 වසරේද ක්‍රියාත්මක කරනු ලැබීය.

- ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ පන්සලෙන් ගමට
- පුනරුත්තාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ ඔසු වගාව
- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සමඟ ආදිවාසීන්ගේ වෙදකම සංරක්ෂණය හා ඔසු වගාව
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ දිවි නැඟුම
- රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සමඟ මාදින්නාගොඩ කාබනික වී වගාව
- දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා දායකත්වය
- එක්ස්පෝ 2013 ආයුර්වේද ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා දායකත්වය

## 6.1 පූජනීය ස්ථානවල ඔසු උයන් ඇරඹීම (පන්සලෙන් ගමට)

පූජනීය ස්ථානවල පවතින ඉඩකඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගනිමින් දේශීය ඔසු වගාව දියුණු කිරීමෙන් විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකි වීම මෙහි විශේෂත්වයකි. දිවිනැගුම ජාතික ව්‍යාපාරයට සමගාමීව, පූජනීය ස්ථානවල ඔසු උයන් ඇරඹීම මේ මගින් සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය ජනාධිපති ලේකම් කාර්යාලයේ ජනාධිපති උපදේශක, බෙංගමුවේ නාලක ස්වාමීන් වහන්සේද, ඒ සඳහා සම්බන්ධීකරණය ජනාධිපති ලේකම් කාර්යාලයේ පූජ්‍ය කොටපොළ මංගල ස්වාමීන් වහන්සේ විසින්ද සිදු කරනු ලබයි. තවද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙලක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, ග්‍රාමීය මට්ටමින් ගම් වැසියන්ගේ ආර්ථික තත්වය නගාසිටුවීමට පිටුවහලක් වන පරිදි විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන ආරම්භ කළ අතර එමගින් යහපත් ඉදිරි දැක්මකින් යුත් සාර්ථක ගොවි මහතුන් බිහිකිරීමට හැකියාව ලැබී ඇත. දැනට මෙම වැඩසටහන මාතර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන 55ක ක්‍රියාත්මක වන අතර තවත් එක් සුවිශේෂී වැඩසටහනක් ලෙස කනංකෙ ප්‍රදේශයේ වසා දමා තිබූ පාසලක් වන හිඟුරුපත්තල කණිෂ්ඨ විද්‍යාල භූමියේ හරිතාගාරයක් තුළ ඔසු උයනක් ස්ථාපිත කිරීම සිදු කරන ලදී.

## 6.2 පුනරුත්තාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමග පවත්වන වැඩසටහන්

බන්ධනාගාර රැඳවියන් හා පුනරුත්ථාපන අභ්‍යාසලාභීන්ගේ යහපත් සෞඛ්‍ය තත්වය පවත්වාගෙන යාම හා ඔවුන්ට ආදායම් මාර්ගයක් උපයා දීමේ අරමුණින් බන්ධනාගාර හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ එක්ව සිදුකරනු ලබන වැඩසටහනකි. මෙම වැඩසටහන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවකගේ දායකත්වයක් ලැබෙන අතර මේ සඳහා මෙවර තෝරා ගෙන ඇත්තේ උතුරු මැද පළාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ කන්දකාඩු නම් ප්‍රදේශයයි.

මෙහිදී එළබටු වගාව නැවත ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය උපදේශක සේවාවන් හා අස්වැන්න අලෙවිකර ගැනීමට අදාළ සේවාවන් සඳහා අවශ්‍ය තාක්ෂණය හා බීජ ලබා දීමට මෙන්ම ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම වෙනුවෙන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

එමෙන්ම පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර තුළ අක්කර 05ක භූමි ප්‍රමාණයක ඖෂධ පැළ වර්ග 31ක්ද, අනුරාධපුර බන්ධනාගාරය තුළ ඖෂධ පැළ වර්ග 12ක්ද, වාරියපොළ බන්ධනාගාරය තුළ පර්චස් 40ක භූමි ප්‍රමාණයක ඖෂධ පැළ වර්ග 24ක් මෙන්ම වීරවිල එළිමහන් සිර කඳවුර තුළ අක්කර 0.25ක භූමි ප්‍රමාණයක ඖෂධ පැළ වර්ග 40ක්ද ලෙස මෙම වැඩසටහන යටතේ ඖෂධ පැළ වගා කිරීම් සිදුකරන ලදී.

තවද දිවයිනේ වගාවන් සිදුකළ යුතු විවිධ දේශගුණික කලාප හා ඒ ඒ කලාපයට ගැලපෙන ඖෂධ වර්ග සම්බන්ධ සියළු කරුණු හා බන්ධනාගාර වගා බිම් පිළිබඳව විස්තර දක්වමින් 2015 වර්ෂය සඳහා ඒකාබද්ධ සැළැස්මක් සකස් කිරීමටද මේ වන විට කටයුතු කරගෙන යනු ලබයි.

## 6.3 අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩසටහන් (පාසල් ඔසු උයන්)

මහින්දෝදය පාසල් වැඩසටහන මඟින් දිවයින පුරා පිහිටි තෝරා ගත් පාසල් 1000ක සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. තවද මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව කේන්ද්‍රීය අරමුණු සාක්ෂාත් කරගනු වස් ප්‍රාථමික පාසල් 5000ක් සහ ද්විතීය පාසල් 1000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහනට දේශීය වෛද්‍ය අමාත්‍යාංශය දායක වී ඇත. ඒ සඳහා ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සහකාර නිලධාරීන් සම්බන්ධ කරවීමෙන් ඒ සඳහා උපදේශණ කටයුතු සිදු කිරීමෙන් එම වැඩසටහන සාර්ථක මං පෙතකට යොමු කරවා ඇත.

## 6.4 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ දිවි නැඟුම

දිළිදුකමින් තොර ඉහළ මැදි ආදායම් ආර්ථිකයක්, ආහාර සුරක්ෂිතතාවය, පිරිසුදු පානීය ජලයෙන් පෝෂිත හා පාරිසරික සුරක්ෂිත බවින් සපිරි රටක් ගොඩනැගීම පෙරදැරිකරගෙන ක්‍රියාත්මක වන වැඩසටහනකි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා එක්ව මෙම වසරේදී ක්‍රියාත්මක කරනුයේ දිවි නැඟුමේ පස්වන අදියරයි. මේ යටතේ තිරසාර ගෙවතු ලක්ෂයක් (100,000) සංවර්ධනය කිරීම හා බීජ හා පැළ ලබාදීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන ඔසු උයන් 06හි නිෂ්පාදනය කරනු ලබන ඖෂධ පැළ හා බීජ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හරහා සපයනු ලබයි.

මෙහි තවත් එක් පියවරක් ලෙස බීජ හා රෝපණ ද්‍රව්‍ය සිටුවීමේ සමාරම්භක උත්සවයක් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ අතර සමාරම්භක උත්සවයට සමගාමීව දිවයින පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පැළ හා බීජ රෝපණය කිරීමට සංවිධානය කර තිබුණි.

## 6.5 රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සමඟ මාදින්නාගොඩ කාබනික වී වගාව

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සමඟ මාදින්නාගොඩ කාබනික ආදර්ශ ගොවිපොළක් ආරම්භ කර ඖෂධීය ගුණයෙන් යුතු දේශීය වී වර්ග වගා කර වස විස වලින් තොර ආහාර නිෂ්පාදනය කිරීම සිදු කරනු ලබයි. මෙම වගාව ආරම්භ කිරීම 2012 මැයි මස සිදු කරන ලද අතර එහි පළමුවන අස්වනු නෙළීම එම වසරේ අගෝස්තු මාසයේදී සිදු කරන ලදී. මෙහි සාමාන්‍ය අස්වැන්න අක්කරයකට බුසල් 80ක් පමණ විය. මෙහි දෙවන අදියර යටතේ පැළ සිටුවීම කථානායක චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

## 6.6 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා දායකත්වය

2013 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන අම්පාර දිස්ත්‍රික්කය මූලික කර ගනිමින් අම්පාර හාඩි විද්‍යාල භූමියේදී පැවැත්විණ. මේ සඳහා අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටිය සහ ඖෂධ උද්‍යානය සියළු දෙනාගේ අවධානයට යොමුවිය.

2013 දැයට කිරුළට සමගාමීව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය අම්පාර ආයුර්වේද රෝහල මූලික කර ගනිමින් වැඩසටහන් රාශියක් සිදු කරනු ලැබූ අතර වර්ෂය පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වනු ලැබූ ජංගම සායන තුළින් යම් යම් රෝගී තත්වයන්ගෙන් පෙළෙන පුද්ගලයින් හඳුනාගෙන ස්ථිර සායන සඳහා පළාත් ආයුර්වේද හා ආයුර්වේද රෝහල් වෙත යොමු කරනු ලැබීය. එමෙන්ම අම්පාර ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනතාවට නේවාසිකව ප්‍රතිකාර ලබාගැනීමේ පහසුකම් පුළුල් කරමින් අම්පාර ආයුර්වේද රෝහලේ නව කාන්තා හා පිරිමි වශයෙන් සියළු පහසුකම් වලින් සමන්විත වාට්ටු 02ක් ඉදිකරන ලදී. ගරු දේශීය වෛද්‍ය අමාත්‍ය සාලින්ද දිසානායක මැතිතුමා අතින් මෙයට මුල්ගල තබා 2013 දැයට කිරුළ වෙනුවෙන් එය විවෘත කරන ලදී.

"රාජ්‍ය නිලධාරීන්ගේ වෘත්තිය සෞඛ්‍ය රැකගැනීමේ වැඩසටහන", "ගැබිණි මව දැයේ සම්පතයි", "වැඩිහිටි සත්කාර වැඩසටහන" හා "ළමා හා මාතෘ පෝෂණ වැඩසටහන" ඇතුළු තවත් වැඩසටහන් ගණනාවක් ප්‍රදේශවාසීන්ගේ සුභ සිද්ධිය උදෙසා දියත් කරන ලදී. මිලියන 11ක ප්‍රතිපාදන යටතේ ත්‍රිකුණාමලය සිද්ධ ආයුර්වේද රෝහල ඉදිකිරීම ආයුර්වේද දෙපාර්තමේන්තුව සිදු කරන ලද අතර මිලියන 24ක ප්‍රතිපාදන යටතේ ඉදිකරනු ලැබූ ත්‍රිකුණාමලය - කන්තලේ සහ පොලොන්නරුව - දිඹුලාගල හෙළ වෙද ගෙදර ඉදිකරන ලදී. මෙම මාහැඟි ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව තවත් ප්‍රජා සේවා ලෙස මිහින්තලේ පාරම්පරික වෛද්‍ය පර්යේෂණායතනයක් සහ ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් රෝහලක් ඉදිකිරීමද, හොරොව්පතාන, පදවිය යන ප්‍රදේශ වල ප්‍රජා සෞඛ්‍ය කාර්යාලයන් 02ක්ද විවෘත කරන ලදී.

2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන වයඹ පළාතේ කුරුණෑගල, කෑගල්ල සහ පුත්තලම දිස්ත්‍රික්ක කේන්ද්‍ර කොට ගනිමින් ඒ හා සමගාමීව නොයෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ග්‍රාමීය මට්ටමේ හා මැතිවරණ කොට්ඨාශ මට්ටමේ ජංගම සේවා පැවැත්වීම සිදු කරනු ලබයි. මීට අමතරව ආයුර්වේද ජීවන දර්ශනය පිලිබඳ සමාජය දැනුවත් කිරීම සහ ඖෂධ වගාව ප්‍රචලිත කිරීම පිලිබඳ වැඩසටහන්ද එම ප්‍රදේශවාසී ජනතාව උදෙසා ක්‍රියාත්මක කරමින් පවතී.


අම්පාර රෝහලේ විවෘත කරන ලද ජ්‍යෙෂ්ඨ පුරවැසි සත්කාර වාට්ටු


දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටිය

## 6.7 එක්ස්පෝ 2013 ආයුර්වේද ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා දායකත්වය

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය හා එක්ව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පූර්ණ සහයෝගය හා අනුග්‍රහය යටතේ 2013 ජූලි 12-14 යන දිනයන්හි කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රම හා නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් නිසි ප්‍රචාරයක් ලබා දී රෝග සමනය සඳහා මෙම වෛද්‍ය ක්‍රමයට ඇති විශ්මිත හැකියාව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම ප්‍රදර්ශනයේ පරමාර්ථය වූ අතර මේ සඳහා දේශීය, විදේශීය ආයුර්වේද ක්ෂේත්‍රයේ නොයෙකුත් භාණ්ඩ හා සේවා සපයන්නන් විශාල පිරිසක් සහභාගී විය. 2013 ආයුර්වේද එක්ස්පෝ ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ හොඳම ප්‍රදර්ශන කුටි අතරින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටියට දෙවන ස්ථානය ලබා ගැනීමට හැකි වීමද සුවිශේෂත්වයකි.

මෙවර පැවති එක්ස්පෝ ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නියෝජනය කරමින් පහත සඳහන් වෙළඳ කුටි පිහිටුවා තිබුණි.

- ඖෂධ පැළ හා ව්‍යාප්ති කටයුතු පිළිබඳ ප්‍රදර්ශන කුටිය
- පංච කර්ම හා යෝග ප්‍රදර්ශන කුටිය
- වෙද ගෙදරක අසිරිය ප්‍රදර්ශන කුටිය හා වෙද මැදුර
- දේශීය ආහාර හා පෝෂණය පිළිබඳ ප්‍රදර්ශන කුටිය
- ග්‍රන්ථ අලෙවිය හා ප්‍රදර්ශනය







**බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ආයුර්වේද එක්ස්පෝ ප්‍රදර්ශනය**

# 07. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් නිකුත් කරන ලද ප්‍රතිපත්ති අංක 10101 හා 10102 යටතේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයීය තොරතුරු තාක්ෂණ අංශය ක්‍රියාත්මක වේ.

ආයුර්වේදය පිළිබඳ දැනුම, අවබෝධය හා ආයුර්වේදීය ජීවන රටාව සම්බන්ධ යහපත් සෞඛ්‍ය පුරුදු ගොඩනැගීමේ අරමුණින් ඖෂධ පැළෑටි, ආයුර්වේදීය ආහාර රටාව හා එදිනෙදා ජීවිතයට අදාළ අත් බෙහෙත් ආදී තොරතුරු ඇතුලත් ඊ මේල් පණිවුඩ සේවාවක් ආකර්ෂණීය ආකාරයෙන් පවත්වාගෙන යාම අමාත්‍යාංශයීය තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදුකරන සුවිශේෂී කාර්යයකි. මෙමඟින් ඊ මේල් භාවිතා කරන රාජ්‍ය නිලධාරීන් 6000කට අධික පිරිසක් සන්නිවේදනය කරනු ලබයි. තවද මෙ යටතේ පහත කාර්යයන්ද කරගෙන යනු ලබයි.

- අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම.
- අමාත්‍යාංශ පරිගණක ජාල පද්ධතිය නඩත්තුව හා අලුත්වැඩියාව සඳහා සහාය වීම.
- පරිගණක නඩත්තුව, අලුත්වැඩියාව හා සේවා කටයුතු සඳහා සහාය වීම.
- අමාත්‍යාංශයේ ග්‍රැෆික් නිර්මාණ කටයුතු (පොත්,වාර්තා,බැනර්,සී.ඩී).




# 08. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා ව්‍යාපෘති/ වැඩසටහන් වල ප්‍රගතිය - 2013

8.1 ආයුර්වේද දෙපාර්තමේන්තුව

8.2 ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

8.3 හෝමියෝපති රෝහල/ වෛද්‍ය සභාව

# 8.1 ආයුර්වේද දෙපාර්තමේන්තුව



1961 අංක 31 දරන පණත අනුව ස්ථාපිත කර ඇති ආයුර්වේද දෙපාර්තමේන්තුව දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ කාර්ය මෙහෙය ඉටු කිරීමෙහිලා මූලිකව කටයුතු කරනු ලබන ආයතනය වන්නේය.

**දෙපාර්තමේන්තුවේ දැක්ම**

ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත

**දෙපාර්තමේන්තුවේ මෙහෙවර**


ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය,
සංවර්ධනය හා
අනන්‍යතාව සුරක්ෂිත කිරීම තුළින්
සැමට සුවසෙත ලඟාකර දීම සඳහා ජාතික මට්ටමින්
වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම

## ප්‍රධාන කාර්යයන්

- පර්යේෂණ හා ශික්ෂණ කටයුතු සඳහා රෝහල් හා අනෙකුත් අංශ පිහිටුවීම හා නඩත්තු කිරීම
- සම්මන්ත්‍රණ, අභ්‍යාස පන්ති, හා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම
- සායනික වෛද්‍ය සේවා හා සාහිත්‍ය පර්යේෂණ පැවැත්වීම
- ඖෂධීය ශාක වගා කිරීම, සංරක්ෂණය හා ප්‍රචලිත කිරීම
- දිවයිනේ සියලු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම
- ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදන ආයතන හා පෞද්ගලික ආයුර්වේද අධ්‍යාපනයට අදාළ කටයුතු සඳහා නීති හා රෙගුලාසි සකස් කිරීම

**ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබන ආයතන**

- රෝහල් සේවා (බොරැල්ල, ගම්පහ, කයිතඩි, මන්වන්තුඩුව, අම්පාර, ත්‍රිකුණාමලය)
- පර්යේෂණ කටයුතු (නාවින්න බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය, හම්බන්තොට චමල් රාජපක්ෂ පර්යේෂණ ආයුර්වේද රෝහල, මිහින්තලය පාරම්පරික පර්යේෂණ රෝහල (ඉදිකරමින් පවතින)
- අධ්‍යාපන හා පුහුණු කිරීම් (දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය)
- ඔසු උයන් (හල්දුම්මුල්ල, පට්ටිපොළ, ගිරාඳුරුකෝට්ටේ, පල්ලේකැලේ, නාවින්න, පින්නදූව, කන්නෙළිය)




## (1) ප්‍රධාන කාර්යාලය

**සාමාන්‍ය පරිපාලනය,**

| | | | |
|---|---|---|---|
| (I) | ආයතන සහ පාලන අංශය | (II) | සංවර්ධන අංශය |
| (III) | ශිල්පීය අංශය | (IV) | විභාග අංශය |
| (V) | ගිණුම් අංශය | | |

# ආයුර්වේද දෙපාර්තමේන්තුව

## ප්‍රධාන කාර්යාලයය

1. ආයතන සහ පාලන අංශය
2. ශිල්පීය අංශය
3. ගිණුම් අංශය
4. සංවර්ධන අංශය
5. විභාග අංශය

## ආයුර්වේද ශික්ෂණ රෝහල්

1. ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල
2. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල(ශික්ෂණ) -යක්කල
3. සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි
4. සිද්ධ ශික්ෂණ රෝහල -ත්‍රිකුණාමලය
5. යුනානි ආයුර්වේද රෝහල -මන්වන්තුඩුව

## නාවින්න ආයුර්වේද පර්යේෂණායතනය

## ආයුර්වේද පර්යේෂණ රෝහල්

1. හම්බන්තොට ආයුර්වේද පර්යේෂණ රෝහල
2. ආයුර්වේද රෝහල- අම්පාර

## දේශිය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

## ඔසු උයන්

1. නාවින්න
2. ගිරාදුරුකෝට්ටේ
3. පල්ලේකැලේ
4. හල්දුම්මුල්ල
5. පින්නදූව
6. පට්ටිපොළ
7. කන්නෙලිය

## ආයුර්වේද වෛද්‍ය සභාව

(I) ආයතන සහ පාලන අංශය

- **2013 වසරේ බඳවා ගැනීම්**

වෛද්‍ය නිලධාරීන් - 183

කම්කරුවන් - 90

බඳවා ගැනීම් පරිපාටි 4ක් (PL 1, PL 2, MN1, MT2) සඳහා අනුමැතිය ලැබී ඇති අතර MN 3 අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.



- **පුහුණු කටයුතු**

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට පුහුණු කටයුතු සඳහා වරින් වර දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

**(II) සංවර්ධන අංශය**

**2013 වසරේ සංවර්ධන අංශයේ ප්‍රගතිය**

- **හිසතෙල් ගෑමේ උත්සවය සහ අනෙකුත් රාජ්‍ය උත්සව**

2013.04.15 - එකම මොහොතක එකම දිසාවක් බලා එකම අරමුණක සැමගේ ගතසිත යොමු කිරීමේ අරමුණින්, රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලබමින් පවත්වන සිංහල හා හින්දු අලුත් අවුරුදු නිමිති කොට පවත්වන හිසතෙල් ගෑමේ රාජ්‍ය මහෝත්සවය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කතරගම කිරිවෙහෙර අබියසදී පවත්වන ලදි. මේ පිළිබඳ විස්තර අමාත්‍යාංශයෙහි ප්‍රගතිය (අංක 5.5) යටතේ දක්වා ඇති අතර වැය කර ඇති මුදල රු. මිලියන 1.8 කි .

- **ජංගම සායන**



ආයුර්වේද හා දේශීය චිකිත්සාව තුළින් කායික සහ මානසික නිරෝගී ජන සමාජයක් ඇති කිරීමේ අරමුණින් ජංගම සායන පැවැත්වේ. රාජ්‍ය ආයතන, විහාරස්ථාන පෞද්ගලික සංගම් සහ පාසැල් වල ඉල්ලීම් අනුව සායන පැවැත්වීම සඳහා රු. මිලියන 1.8 වැයකර ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව රෝහල් වෙත එම කාර්යය පවරන ලදි.

- ආයුර්වේද රෝහල් වෙත පැවරීම - ජංගම සායන 47
- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු වලට පැවරීම - ජංගම සායන 13

- **ආයුර්වේද බෙහෙත් සහ කැඳ වර්ග ප්‍රචලිත කිරීම -** පෝෂ්‍යදායි සහ දේශීය පාන කෙරෙහි ජනතාව නැඹුරු කිරීමේ අරමුණින් රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධානවල උත්සව සඳහා කොළකැඳ, ඔසුපැන් නොමිලේ ලබා දෙන ලදී.



- **ආයුර්වේද ප්‍රදර්ශන**

ලංකාවට ආවේණික වු ඖෂධ පැළෑටි පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ප්‍රදර්ශන සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් අනුව දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම.




- **සීතාවක අභිමන පුරාවිද්‍යා** , අධ්‍යාපනික හා තාක්ෂණික ප්‍රදර්ශනය-2013
- **කුමරි සිප්සුරු ප්‍රභා වෙළඳ ප්‍රදර්ශනය**, වේල්ස් කුමරි විද්‍යාලය
- **සිද්ධ සිම්පෝසියම් හා ප්‍රදර්ශනය**- 2013, යාපනය නාවක්කිරි ඔසු උද්‍යානය
- **ආයුර්වේද එක්ස්පෝ ප්‍රදර්ශනය** -2013
- **දැයට කිරුළ ප්‍රදර්ශනය** - 2013, හාඩි විශ්ව විද්‍යාලය, අම්පාර
- **අපේ උරුමය සංස්කෘතික ප්‍රදර්ශනය**, කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ ජාතික පාසැල. මුල්ලේරියාව
- **හරසර අධ්‍යාපන සහ වෙළඳ ප්‍රදර්ශනය**, පැලියගොඩ ශ්‍රී ධර්මාලෝක විද්‍යාලය
- **බලි ශාන්ති කර්ම යාගය**, දියවන්නා කමත අභියස
- **රෙජිනෝල්ඩ් කුරේ අමාත්‍යතුමාගේ ජනතා මෙහෙවර උපහාර**, පානදුර මෝදරවිල ක්‍රිඩාංගනය
- **සත්වෝද්‍යාන සතිය**, ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- **රැන්ඩිල්ස් ප්‍රදර්ශනය සහ සැනකෙළිය,** මහනුවර ගැටඹේ ක්‍රීඩාංගනය

2013 **ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විශේෂ අවස්ථා**





**2013 දැයට කිරුළ ප්‍රදර්ශනය**





**අම්පාර වැඩිහිටි වාට්ටු සංකීර්ණය විවෘත කිරීම**





2013 හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය





**EX-PO** ආයුර්වේද ප්‍රදර්ශනය

- **ඔසු උයන් නැරඹීම**

පාසැල් ළමුන්, දේශිය සංචාරකයන්, විදේශිය සංචාරකයින් මෙන්ම අධ්‍යයන කටයුතු සඳහා පැමිණෙන්නන්ට ඔසු උයන් නැරඹිය හැක.



**ඔසු උයන් නැරඹීමට පැමිණි පිරිස**

| ඔසු උයන | පින්නදූව | පට්ටිපොළ | හල්දුම්මුල්ල | පල්ලේකැලේ | නාවින්න | ගිරාදුරුකෝට්ටේ |
|---|---|---|---|---|---|---|
| පාසල් ගණන | 15 | 3 | 60 | 40 | 4 | 2 |
| අධ්‍යාපන කටයුතු සඳහා පැමිණි ගණන | 346 | 422 | - | 352 | 69 | 55 |
| පර්යේෂණ කටයුතු සඳහා පැමිණි ගණන | 3 | 21 | 12 | 97 | 25 | - |
| විදේශිය සංචාරකයින් ගණන | 16 | 0 | 11 | 15 | 5 | - |
| දේශිය සංචාරකයින් ගණන | 141 | 0 | 83 | 157 | 8 | - |
| **එකතුව** | **521** | **485** | **60** | **661** | **104** | **57** |

- **කොළකැද කට්ටල, ඔසු උයන් කට්ටල  සහ පොත් කට්ටල ලබා දීම -**

ක්‍රිස්තුරාජ විද්‍යාලය, චන්ද්‍රජෝති විහාරය, මාදිවෙල, කෝට්ටේ සහ ශ්‍රී රතනජෝති පිරිවෙන, ශ්‍රී සුභද්‍රාරාමය, නිකපොත, හපුතලේ

- **පොත් කට්ටල ලබා දීම**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින් සඳහා, වෛද්‍ය විද්‍යාල, පාසැල්, ගුණ සමරුඋත්සව, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු , හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවයේ සම්භාවනීය අමුත්තන්ට, ආයුර්වේද ශාස්ත්‍රි සහතික පත්‍ර ප්‍රදානය කිරිමේ උත්සව, පුස්තකාල ප්‍රයෝජනය සඳහා සහ විහාර සඳහා පොත් කට්ටල ලබා දෙන ලදී.




- **නොමිලේ ඔසු පැළ ලබා දීම**

දේශිය ඖෂධ වගාව ව්‍යාප්ත කිරිමේ අරමුණින් පාසැල්, රාජ්‍ය ආයතන සඳහා ඉල්ලීම් අනුව සහන මිලට සහ නොමිලේ ඔසු පැළ 25 බැගින් ආයුර්වේද කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ඔසු උයන් වලින් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

- **ඉදිකිරිම්, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු**

2013 වසරේ ඉදිකිරිම්, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු වල ප්‍රගතිය.

| ආයතනය | විස්තරය |
|---|---|
| ප්‍රධාන කාර්යාලය - රියදුරු විවේකාගාරය | ඇස්තමේන්තු මුදල - රු මිලි.2.99(වැට් සමග).ඉදිකිරිම් ප්‍රගතිය -60% |
| බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල රෝහල් සංකිර්ණය ඉදිකිරිම - ප්‍රධාන සැලැස්ම (11 අදියර)<br>ඇස්තමේන්තු මුදල - රු බිලියන 1.9 | මාගා ආයතනය ඉදිකිරිම් භාරගැනිමට එකග විය. ව්‍යුහාත්මක වෙනස්කම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අනුමැතිය යටතේ සිදු කෙරේ. මිල විචලනයන් පිළිබඳ මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය අනුව අනුමැතිය ලබා ගැනිමට කටයුතු කෙරේ. |
| යක්කල ආයුර්වේද රෝහල සංවර්ධනය- ඇස්තමේන්තු මුදල - රු.මිලියන 1,010 තට්ටු 10ක ගොඩනැගිල්ල | විද්‍යායතනය සඳහා වෙන් වී ඇති ඉඩමෙන් අක්කර 4ක භූමි ප්‍රමාණයක් ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ. |
| ජාතික සහ ප්‍රාදේශීය වශයෙන් ඇති වැඩිහිටි වාට්ටු වැඩි දියුණු කිරිම - ත්‍රිකුණාමලය ආයුර්වේද රෝහල (ගැහැණු/පිරිමි) | ඇස්තමේන්තු මුදල - රු මිලි. ගැහැණු වාට්ටු-3.864<br>ඇස්තමේන්තු මුදල - රු මිලි. පිරිමි වාට්ටු -3.864<br>ඉදිකිරිම් ප්‍රගතිය - 95% |
| වැඩිහිටි වාට්ටු යා කෙරෙන කොරිඩෝව | ඇස්තමේන්තු මුදල - රු මිලි. .676. කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. |
| මායිම් වැට සමග බාධක බැම්ම | ඇස්තමේන්තු මුදල - රු මිලි. 1.093. ප්‍රසම්පාදන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. |
| සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ රෝහල ඉදිකිරිම - මිහින්තලය | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කරයි. ඉදිකිරිම් ප්‍රගතිය -70%<br>මුළු ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 588.7 |

| ආයතනය | විස්තරය |
|---|---|
| චමල් රාජපක්ෂ ආයුර්වේද රෝහල (හම්බන්තොට) - කොරිඩෝව ඉදිකිරීම | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන පවරා ඇත. (රු.මිලි.3.976)ල |
| නාවින්න පර්යේෂණ රෝහල - පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම | මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් අනුමැතිය සඳහා යොමු කර ඇත. |
| දේශීය වෛද්‍ය ක්‍රම පිළිබද ජාතික ආයතනය- ආපන ශාලාව සමග ශ්‍රවණාගාරය සහ නව වැසිකිළි පද්ධතිය ඉදි කිරීම (2 අදියර) | ඇස්තමේන්තු මුදල රු. මිලියන 6.044 (වැට් සමග). ඉදිකිරීම් ප්‍රගතිය -60% |
| **ඔසු උයන් වල ඉදිකිරීම් කටයුතු** | |
| සේවක විවේකාගාරය(ගැහැණු) සහ ඔසු උයනේ ඉදිකිරීම් - හල්දුම්මුල්ල | ඇස්තමේන්තු මුදල රු. මිලියන 5. ඉදිකිරීම් ප්‍රගතිය -60% |
| ශ්‍රවණාගාරය ඉදිකිරීම (2 අදියර)- උද්‍යාන නිල නිවස - ගිරාදුරුකෝට්ටේ | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ඉදිකිරීම් ප්‍රගතිය - 75% |
| ඔසු උයන් වටා වැට ඉදිකිරීම - හල්දුම්මුල්ල, පින්නදූව, කන්නෙලිය | ඇස්තමේන්තු මුදල රු. මිලියන 6. ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. |
| **අළුත්වැඩියා කටයුතු** | |
| රෝහල් අළුත්වැඩියාවන්- බොරැල්ල, කයිතඩි, යක්කල (පංචකර්ම ගොඩනැගිල්ල) | ඇස්තමේන්තු මුදල රු. මිලියන 3, ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. |
| රෝහල් අළුත්වැඩියාවන්- අම්පාර, මන්චන්තුඩුව | ඇස්තමේන්තු මුදල රු. මිලියන 2.5, ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. |
| ආයුර්වේද පර්යේෂණ රෝහල, නාවින්න | ඇස්තමේන්තු මුදල රු. මිලියන 4<br>පරිඝණක කාමරය සහ විද්‍යාගාරයේ වීදුරු වහලේ අළුත්වැඩියාව, මායිම් තාප්පය අළුත්වැඩියාව - ප්‍රසම්පාදන කටයුතු කටයුතු සිදුකරමින් පවතී. ගබඩාව අළුත්වැඩියාව- ප්‍රගතිය 100%. සේවක වැසිකිළි සහ නාන කාමර අළුත්වැඩියාව- කොන්ත්‍රාත්තරුවන් හට භාර දී ඇත. |
| දේශීය වෛද්‍ය ක්‍රම පිළිබද ජාතික ආයතනය - කාමර අළුත්වැඩියාව සහ පිවිසුම් ස්ථාන අත්වැල සකස් කර ගැනිම. | ඇස්තමේන්තු මුදල රු. මිලියන 0.223. ප්‍රසම්පාදන කටයුතු සඳහා භාර දී ඇත. |
| හල්දුම්මුල්ල ඔසු උයන - වහල අළුත්වැඩියාවන් | ඇස්තමේන්තු මුදල -රු.මිලි 0.45. අළුත්වැඩියාවන් අවසන් කර ඇත. |

**(III) ශිල්පීය අංශයේ කටයුතු වල ප්‍රගතිය.**

❖ යෝග සංග්‍රහ කමිටු සහ අනුකමිටු රැස්කර ආනයනික හා දේශිය ඖෂධයන්ට අනුමැතිය ලබා දීම - නියමිත ගාස්තු අය කිරීම තුළින් ලැබු ආදායම

- දේශීය ඖෂධ ලියාපදිංචි කිරීම - රු 283,600.00
- ආනයනික ඖෂධ ලියාපදිංචි කිරීම - රු.672,500.00
- මුළු ආදායම - රු.956,100.00

❖ නිමි ඖෂධ ආනයන සමාගම් ලියාපදිංචි කිරීම - සමාගම් ගණන 05

❖ ආනයනික නිමි ඖෂධ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය - නිෂ්පාදන 2

- ❖ දේශීය නිෂ්පාදන (ඖෂධ)ලියාපදිංචි කිරීම - දේශීය නිෂ්පාදන 73
- ❖ නීති සංග්‍රහ සහ අණපනත් සකස් කිරීම - අණ පණත් 27
- ❖ ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ සිදුවන විමර්ශන කටයුතු සිදු කිරීම - 2013 වසරේ සිදු කරන ලද විමර්ශනයන්හි වාර්තාවන් ආයුර්වේද කොමසාරිස් වෙත භාර දී ඇත.
- ❖ පෞද්ගලික ආයුර්වේද (වෛද්‍ය සහ ආශ්‍රිත) සේවා ආයතන ලියාපදිංචි කිරීම -2013 වසරේදී,
    - පංචකර්ම ආයතන - 21
    - බෙහෙත් ශාලා - 121
    - රෝහල් - 05
    - හෝටල් - 08
- ❖ තීරු බදු රහිතව වියළි ඖෂධ ආනයනය සඳහා අවශ්‍ය අවසර ලබා දීම
    - වියළි ඖෂධ - කිලෝග්‍රෑම් 1,495,721.50

      එහි වටිනාකම - ඇමෙරිකන් ඩොලර් 3,889,841.60
- ❖ ආයුර්වේද ග්‍රන්ථ මුද්‍රණය සඳහා නිර්දේශය ලබා දීම- 2013 ආයුර්වේද සමීක්ෂාව මුද්‍රණය කිරීම
- ❖ කතෘ භාගය ගෙවීම සම්බන්ධ ගැටළු නිරාකරණය කර අදාළ කටයුතු ඉදිරියට කරගෙන යමින් පවතී.
- ❖ පර්යේෂණ අරමුදල සක්‍රියව පවත්වාගෙන යයි.
- ❖ ඖෂධ නිෂ්පාදනය සඳහා නිෂ්පාදනාගාර 20ක් සඳහා (2013 වසර තුළ) කංසා කිලෝග්‍රෑම් 276.16 නිකුත් කර ඇත.
- ❖ ඖෂධ නිෂ්පාදන සඳහා නිෂ්පාදනාගාර 08ක් සඳහා පරිපාක ස්ප්‍රීතු ලීටර 78,180 නිකුත් කර ඇත.
- ❖ 2013 වසර තුළ නිෂ්පාදනාගාර බලපත්‍ර 156ක් නිකුත් කර ඇත.
- ❖ 2013 වසර තුළ වෙළඳ සැල් බලපත්‍ර 113ක් නිකුත් කර ඇත.



**(IV) විභාග අංශය**

විභාග පැවැත්වීම

| ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|
| ආයුර්වේද ශාස්ත්‍රී පරීක්ෂණය | ලියාපදිංචි වූ සිසුන් ගණන - 255 |
| ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික හා අතිරේක පරීක්ෂණ පැවැත්වීම හා සමත් වන සිසුන්ට සහතික පත්‍ර පිරිනැමීම | 1. ආයුර්වේද ශාස්ත්‍රී 2013 (නොවැම්බර්) සිසුන් - 674<br>2. අතිරේක පරීක්ෂණය 2013 (මැයි) සිසුන්- 404 |
| ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන සහකාර නිලධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීම | සහභාගි වූ සංඛ්‍යාව<br>1. 2013 අප්‍රේල් - 130<br>2. 2013 නොවැම්බර් - 25 |

| ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
| --- | --- |
| ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ පැවැත්වීම | සහභාගි වූ සිසුන් සංඛ්‍යාව<br>1. 2013 අප්‍රේල් - 238<br>2. 2013 ඔක්. - 142 |
| උපස්ථායක, ඖෂධ සංයෝජක, සම්බාහන පාඨමාලා සහ පංචකර්ම උසස් සහතික පත්‍ර පාඨමාලාව ආදියට අවසාන ඇගයිම් පරික්ෂණ පැවැත්වීම | සම්බාහන පාඨමාලාව (2013 අගෝ.) ප්‍රතිඵල නිකුත් කළ සංඛ්‍යාව - 23<br>උපස්ථායක සඳහා - 95 |

**(V) ගිණුම් අංශය**

උත්සව අත්තිකාරම් ලැබූ නිලධාරින් සංඛ්‍යාව -975

විශේෂ අත්තිකාරම් ලැබූ නිලධාරින් සංඛ්‍යාව -975

ආපදා ණය පහසුකම් ලැබූ නිලධාරින් සංඛ්‍යාව -925

2013 වර්ෂය සඳහා අත්තිකාරම් බී ගිණුම යටතේ ලැබුණු මුළු මුදල - රු.27,637,929.78

ගෙවන ලද මුළු මුදල -රු. 25,148,296.89

## (2) ආයුර්වේද ශික්ෂණ රෝහල්

### (I) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල





නේවාසික හා බාහිර රෝගි සත්කාර සේවා පවත්වාගෙන යෑම හා රාජගිරිය ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ සිසුන් සඳහා ශික්ෂණ රෝහලක් ලෙසින් ක්‍රියාත්මක වේ.

ආරම්භය - 1929,

දිස්ත්‍රික්කය - කොළඹ

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය -තිඹිරිගස්යාය

ඇඳන් සංඛ්‍යාව - 195

වෛද්‍ය නිලධාරින් - 116

හෙද නිලධාරින් - 19

අනෙකුත් කාර්ය මණ්ඩලය - 218

- **රෝගි සංඛ්‍යා ලේඛන -2013**

  බාහිර රෝගින් ගණන -215,652, බාහිරාංශය විවෘතව වූ දින ගණන - 341

- **නේවාසික රෝගි සංඛ්‍යා ලේඛණය - 2013**


  ඇතුළත් වූ රෝගින් සංඛ්‍යාව -1986

**ඖෂධ නිෂ්පාදන ධාරිතාව**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. ක්වාත | - බෝතල් | 50300 | | 7. වටී | - කිලෝග්‍රෑම් | 70.9 |
| 2. චූර්ණ | - කිලෝග්‍රෑම් | 4248.95 | | 8. කාෂ් | - කිලෝග්‍රෑම් | 235.50 |
| 3. කල්ක | - කිලෝග්‍රෑම් | 1342.800 | | 9. ලේප | - කිලෝග්‍රෑම් | 1249.65 |
| 4. තෛල | - බෝතල් | 10953 | | 10. ආසව | - බෝතල් | 9258 |
| 5. අරිෂ්ඨ | - බෝතල් | 4326 | | 11. ක්ෂාර සූත්‍ර | - නූල් | 556 |
| 6. ගුගුල් | - කිලෝග්‍රෑම් | 414.03 | | | | |


- **විශේෂ සායන**

| <u>සායන</u> | <u>රෝගීන් සංඛ්‍යාව</u> |
|---|---|
| Helpage | 978 |
| හෙළවෙද පුනරුද (පාර්ලිමේන්තුව) | 562 |
| පාර්ලිමේන්තු ආයු.මධ්‍යස්ථාන | 2,632 |



## (II) <u>ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල (ශික්ෂණ) - යක්කල</u>






| | |
|---|---|
| ආරම්භය | - 1984 ජූනි |
| නේවාසික ප්‍රතිකාර ලැබීම සඳහා ඇති වාට්ටු ගණන | - 4 |
| ඇඳන් සංඛ්‍යාව | - 107 |
| වෛද්‍ය නිලධාරින් ( ස්ථිර) | - 16 |
| හෙද/හෙදි නිලධාරින් | - 8 |
| අනෙකුත් කාර්ය මණ්ඩලය | - 67 |

- **රෝගී සංඛ්‍යා ලේඛන**

| | |
|---|---|
| බාහිර රෝගීන් ගණන | - 54,852 |
| නේවාසික රෝගීන් ගණන | - 26,510 |

ජ්‍යෙෂ්ට පුරවැසි සායන රෝගීන් සංඛ්‍යාව - 924

ජංගම සායන රෝගීන් සංඛ්‍යාව - 1,023

| ආයතනය විවෘතව තිබූ දින ගණන | පළමු පැමිණීම | නැවත පැමිණීම | එකතුව | සාමාන්‍ය දෛනික පැමිණීම | බාහිර රෝගීන් සඳහා නිකුත් කළ ඖෂධ වල වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 291 | 30,164 | 24,688 | 54,852 | 188 | 10,270,020.00 |

2013 වසරේ නේවාසික රෝගීන්ට නිකුත් කළ ඖෂධවල වටිනාකම -රු 4,904,350.00



**නිෂ්පාදන ධාරිතාව**

1. ක්වාථ වර්ග 16කි - බෝතල් 10240
2. පාණ්ඩ වර්ග 24කි. - කිලෝ 3416 ග්‍රෑම් 650
3. චූර්ණ වර්ග 16කි. - කිලෝ 716 ග්‍රෑම් 650
4. අරිෂ්ඨ ආසව - බෝතල් 648
5. තෛල වර්ග - බෝතල් 1145
   - ❖ සර්ෂපාදි තෙල් - බෝතල් 506
   - ❖ පිණ්ඩ තෙල් -බෝතල් 4488
   - ❖ නීල්‍යාදි තෙල් - බෝතල් 191
6. ගෝක්ෂුරාදි ගුගුල් - කිලෝ 3 ග්‍රෑම් 500
7. නවරත්න කල්කය - කිලෝ 31 ග්‍රෑම් 700
8. ලාක්ෂාදි ලේපය - කිලෝ 22 ග්‍රෑම් 600



දෛනිකව අවශ්‍ය වන කෂාය වර්ග, පත්තු, මැල්ලුම් සහ ලේප වර්ග නිෂ්පාදනය කරනු ලබයි.

## (III) ආයුර්වේද ශික්ෂණ රෝහල -කයිතඩි




බාහිර රෝගි අංශය විවෘත කිරීම -1973.06.29

වාට්ටු සංකීර්ණය විවෘත කිරීම -1978.10.02

වෛද්‍ය නිලධාරීන් - 10

හෙද නිලධාරීන් - 01

සේවක සංඛ්‍යා - 30

ඇඳන් සංඛ්‍යාව - 150

- **රෝගි සංඛ්‍යා ලේඛන**

| බාහිර රෝගීන් ගණන | විශේෂ සායන සඳහා පැමිණි රෝගීන් ගණන | නේවාසික රෝගීන් ගණන |
|---|---|---|
| 31,114 | 8,073 | 933 |

- **විශේෂ සායන සඳහා සහභාගි වූ රෝගි සංඛ්‍යා ලේඛන**

| | වැඩිහිටි සායන | විශේෂ ප්‍රතිකාර | නාරිවේදි | දියවැඩියාව | ළමා | කටු චිකිත්සා |
|---|---|---|---|---|---|---|
| එකතුව | 3456 | 1848 | 163 | 372 | 118 | 318 |

| | වෛද්‍ය සායන | ජංගම සායන | විශ්ව විද්‍යාල |
|---|---|---|---|
| එකතුව | 349 | 836 | 613 |

- **ඖෂධ නිෂ්පාදනය**

චූර්ණ වර්ග 8 - කිලෝ. 223.150
ගුලි වර්ග 3 - කිලෝ. .511
තෛල වර්ග 4 - බෝතල 893
වාසක සිරප් බෝතල් 107 1/2
රෝගනිකාෂ් කිලෝ. 38.950
පඩිකලිංග කුඩු කිලෝ. 0.400
පූන්ගාවි චින්තුරම් කිලෝ. 0.845

## (IV) මන්වන්තුඩුව ආයුර්වේද රෝහල

**සේවක සංඛ්‍යා තොරතුරු -**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| කාර්ය භාර වෛද්‍ය නිලධාරින් | 1 |
| වෛද්‍ය නිලධාරි | 4 |
| උපස්ථායක | 1 |
| සාමාන්‍ය කම්කරු | 3 |

**රෝගින් පැමිණීම -**

පළමු පැමිණීම - 1547
නැවත පැමිණි - 5060

**විශේෂ සායන -** 2013.07.06 දින පවත්වන ලද අතර ඒ සඳහා රෝගින් 350ක් සහභාගි විය.

## (V) සිද්ධ වෛද්‍ය ශික්ෂණ රෝහල -ත්‍රිකුණාමලය

- **සේවක සංඛ්‍යා තොරතුරු**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| 1. වෛද්‍ය නිලධාරින් | 04 |
| 2. හෙද නිලධාරින් | 02 |
| 3. කම්කරුවන් | 06 |
| 4. මුරකරු | 02 |

- **2013 ප්‍රතිකාර ලැබූ බාහිර රෝගින් ගණන -** 16,302

# (3) ආයුර්වේද පර්යේෂණ රෝහල්

## (I)අම්පාර ආයුර්වේද රෝහල



**සේවක සංඛ්‍යා තොරතුරු**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය නිලධාරින් | 04 |
| පාරම්පරික වෛද්‍ය නිලධාරින් | 03 |
| භෛසජ්ජක | 01 |
| උපස්ථායක/උපස්ථායිකා | 03 |
| කම්කරු | 12 |
| සනීපාරක්ෂක කම්කරු | 09 |

**බාහිර රෝගී සංඛ්‍යා ලේඛණ**

| | ආයතනය විවෘතව තිබූ දින ගණන | පළමු පැමිණීම | නැවත පැමිණීම | එකතුව | සා.දෛනික පැමිණීම | බාහිර රෝගීන් සඳහා නිකුත් කළ ඖෂධවල වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| එකතුව | 295 | 14552 | 11799 | 26351 | 1067 | 3,476,676.84 |

**නේවාසික රෝගී සංඛ්‍යා ලේඛණ**

වාට්ටු ගණන - 02 ඇඳන් සංඛ්‍යාව - 24

| | ඇතුළත් වූ රෝගීන් | පිටව ගිය රෝගීන් | නේවාසික රෝගීන්ට නිකුත් කළ ඖෂධවල වටිනාකම |
|---|---|---|---|
| එකතුව | 174 | 183 | 362,421.83 |

**2013 නිෂ්පාදන ධාරිතාව (වර්ගය සහ ප්‍රමාණය)**

| ඖෂධ වර්ග | ප්‍රමාණය (750 ml බෝ.) | ඖෂධ වර්ග | ප්‍රමාණය (750 ml බෝ.) |
|---|---|---|---|
| ත්‍රිඵලා ක්වාථ | 553 | ත්‍රිකටුකාදී ක්වාථ | 606 |
| රාස්නා සප්තක ක්වාථ | 232.5 | පිප්පල්‍යාද්‍යාසවය | 50 |
| දශමූලාදී ක්වාථ | 370 | පුනර්නවාසවය | 40 |
| ඒ රණ්ඩ සප්තක ක්වාථ | 247 | නිර්ගුණ්ඩියාදි තෛලය | 118 |
| නාගරාදි ක්වාථ | 237.5 | නීල්‍යාදි තෛලය | 50 |
| මධුමේහ හරණී ක්වාථ | 397 | සර්ෂපාදි තෛල | 442 |

- **විශේෂ සායන සහ රෝගීන් සංඛ්‍යාව**

**සායන 9** -විහාරස්ථාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන, වැඩිහිටි නිවාස සහ ප්‍රජා ශාලා

**රෝගීන් සංඛ්‍යාව - 463**

## (II) <u>චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට</u>



**රෝහල විවෘත කිරීම- 2010.10.31**

**මූල්‍ය ප්‍රතිපාදන** - රු.මිලියන 110.05 ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදාන

**2013 සේවක සංඛ්‍යා තොරතුරු**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 1 |
| වෛද්‍ය නිලධාරි | 9 |
| හෙද නිලධාරි | 05 |
| අනෙකුත් කාර්ය මණ්ඩලය | 19 |

**රෝගී සංඛ්‍යා ලේඛණ -2013**

| බාහිර රෝගී අංශය | | නේවාසික අංශය | |
|---|---|---|---|
| **අලුත් පැමිණීම** | **නැවත පැමිණීම** | **පිරිමි** | **ගැහැණු** |
| 11,422 | 14,878 | 453 | 404 |

**ඖෂධ නිෂ්පාදනය**

**ඖෂධ වර්ග** - 40, **නිෂ්පාදිත ප්‍රමාණය -**

ක්වාථ - බෝතල් 653, තෛල - බෝතල් 403, චූර්ණ - කි.ග්‍රෑ 138.79, දත් බෙහෙත් - කි.ග්‍රෑ.3, ලක්ෂාදිලේපය - කි.ග්‍රෑ.9.750, තෝර පැණිය- බෝ.7, ඇහැල පැණිය - බෝ.06, සර්ෂපාදි බාම් - කි.ග්‍රෑ.19, මී බාම් - කි.ග්‍රෑ.20, කණ්ඨකාරි පැණිය - බෝතල් 40, ඉගුරු කොත්තමල්ලී - කි.ග්‍රෑම් 4.850, වාසක පැණිය - බෝතල් 12, රසෝත්තමාදි ලේපය - කි.ග්‍රෑ 8 සහ කුෂ්මාණ්ඩාවලේහය - කි.ග්‍රෑ.8.250

## (4) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය






ආරම්භය - 1962

දිස්ත්‍රික්කය - කොළඹ

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය -මහරගම

නේවාසික ප්‍රතිකාර ලැබිම සඳහා ඇති වාට්ටු ගණන - 4

ඇඳන් සංඛ්‍යාව - 66

**2013 වර්ෂයේ පැවැත්වු සායන හා රෝගීන් පිළිබඳ තොරතුරු**

| **සංරචකය** | **සංඛ්‍යාව** |
|---|---|
| 2013 වර්ෂයේ පැවැත්වු අක්ෂි සායන | 48 |
| 2013 වර්ෂයේ පැවැත්වු දියවැඩියා සහ අධි රුධිර පීඩන සායන | දියවැඩියා -51<br>මේදස් වෘද්ධි -50 |
| ඇඳන් සංඛ්‍යාව | 66 |
| දිනකට ඇතුළත් වන රෝගීන් සංඛ්‍යාව | 05 |
| දිනකට ප්‍රතිකාර ලබන බාහිර රෝගීන් සංඛ්‍යාව | 700 |
| 2013 වසර ප්‍රතිකාර ලැබු මුළු රෝගීන් සංඛ්‍යාව | 105,636 |
| නේවාසික රෝගීන් | 1,197 |
| බාහිර රෝගීන් | 104,433 |



කාර්යාල ගොඩනැගිල්ල



බාහිර රෝගී ගොඩනැගිල්ල

**මිලියන -300 ව්‍යාපෘතිය 2013 ප්‍රගතිය**

- සංවිධාන ව්‍යුහය ශක්තිමත් කිරිම
- ශ්‍රී ලංකාව තුළ සෞඛ්‍ය පර්යේෂණවල තත්ත්වය පුළුල් කිරිම - හෘද රෝග, දියවැඩියාව, පිළිකා රෝග, නිදන්ගත වකුගඩු රෝග පිළිබඳ පර්යේෂණ
- ජාතික සහ අන්තර් ජාතික මට්ටමින් අන්තර් ක්ෂේත්‍ර සහ අන්තර් විෂයානුබද්ධ සහයෝගිත්ව පර්යේෂණ දිරිගැන්වීම.
- නිෂ්පාදනාගාරයේ අවශ්‍යතා තක්සේරු කිරිම
- පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරිම



**නාවින්න ඔසු උයන පැළ තවාන ප්‍රගතිය**

| අළුතින් සකසන ලද පැළ | විකුණු පැළ | ආදායම (රු.) | නොමිලේ දුන් පැළ | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 15,906 | 8,448 | 469,560 | 4,396 | 150,876 |

**උද්භිද විද්‍යා අංශය**

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| ඖෂධීය අමුද්‍රව්‍ය ලෙස පොතු වර්ග භාවිතා වන ශාක තුනක නිවැරදි අස්වනු නෙළීම හා සැකසීම පිළිබඳ පර්යේෂණය | 70% |
| ජල රෝපණ ක්‍රමය භාවිතයෙන් ජලජ ඖෂධ පැළැටි ගුණනය කිරිමේ පර්යේෂණ- කීකිරිදිය සහ ලුණුවිල | කීකිරිදිය - 70%<br>ලුණුවිල - 100% |
| ඖෂධීය අමුද්‍රව්‍ය 20ක උද්භිද හා රසායනික ප්‍රමිති සැකසීම | 80% |
| මානව උද්භිද විද්‍යා සමීක්ෂණවලදී රැස්කරන ලද ඖෂධීය ශාක පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් සැකසීම | 75% |
| වියළි ශාකාගාරය යාවත්කාලීන කිරිම, නව නිදර්ශක එක් කිරිම | 25% |

**ප්‍රමිතිකරණ අංශය**

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|
| ආයුර්වේද ඖෂධ 4ක ප්‍රමිති සකස් කිරීම | තාලිසාදි චූර්ණයේ පරීක්ෂණ කටයුතු අවසන් කිරීම. |
| බාහිර ඖෂධ සාම්පල විශ්ලේෂණය | ඖෂධ සංස්ථාව මගින් එවන ලද මී පැණි සාම්පල 2 සඳහාද, ත්‍රිකුණාමලය IDMC ආයතනය මගින් එවන ලද ආයුර්වේද, සිද්ධ, යුනානි ඖෂධ 12 සඳහාද, මාතර අපරාධ විමර්ශන අංශය මගින් එවන ලද ඖෂධ සාම්පල සඳහාද විශ්ලේෂණ වාර්තා ලබා දීම |
| ගබඩාවෙන්/ඖෂධ නිෂ්පාදනාගාරයෙන් ලැබෙන ඖෂධ පරීක්ෂා කිරීම | ගබඩාවෙන් එවන ලද මී පැණි, අබතෙල්, තලතෙල්, එඬරු තෙල් සාම්පල පරීක්ෂාව |
| GCMS උපකරණය මගින් සගන්ධ තෙල් විශ්ලේෂණය කිරීම | කුරුඳුකොළ හා පැගිරිමාන කොළවල සගන්ධ තෙල් ලබාගෙන, විශ්ලේෂණ කටයුතු කරගෙන යාම |
| ප්‍රමිතිකරණය/තත්ත්වපාලනය පිළිබඳ අධ්‍යාපනික වැඩමුළු පැවැත්වීම | ප්‍රාථමික පුහුණු වෛද්‍ය නිලධාරීන්, විදේශ සිසුන් කණ්ඩායම් ප්‍රමිතිකරණය පිළිබඳ දැනුවත් කිරීම |

**2013 වර්ෂයේ නිෂ්පදනාගාරයේ ඖෂධ නිෂ්පාදනය**

| | |
|---|---|
| අරවින්දාසවය (750 ml) | බෝතල් 1226 |
| පිප්ලාස්වය (750 ml) | බෝතල් 3938 |
| පුනර්නාසවය (750 ml) | බෝතල් 2396 |
| ත්‍රිපලානේත්‍රා බින්දු (750 ml) | බෝතල් 12 |

| | |
|---|---|
| වාසක පැණිය | බෝතල් 159 |
| චූර්ණ 5 | කිලෝ 1194.85 |
| තෛල 3(750 ml) | බෝතල් 1723 |
| කෛශෝරක ගුග්ගලු | කිලෝ. 6.25 |
| චන්ද්‍ර කල්කය | කිලෝ. 4 |

# (5) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය



**දැක්ම** - ඉදිරි දශකයට දැනුමෙන් පිරිපුන්, කුසලතා පූර්ණ දේශිය වෛද්‍ය ප්‍රජාවක් බිහිකරලීම

**මෙහෙවර** - ආයුර්වේදීය මානව සම්පත් සංවර්ධනයේ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීම

**2013 පුහුණු වැඩසටහන් පිලිබඳ සාරාංශය**

| වැඩසටහන | ක්‍රියාකාරකම් | පුහුණු සංඛ්‍යාව | ප්‍රතිලාභීන් | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බෝ නොවන රෝග | බෝ නොවන රෝග පාලනය හා වැලැක්වීම | 02 | වෛද්‍ය නිලධාරී<br>පාරම්පරික වෛද්‍යවරු | 120<br>50 |
| | පෝලියෝ | 01 | වෛද්‍ය නිලධාරී | 131 |
| | ආතරයිටිස් | 01 | - එම - | 71 |
| | වකුගඩු රෝග නිවාරණය සඳහා වැඩමුළු | 01 | - එම - | 18 |
| | මානසික රෝග | 01 | - එම - | 45 |

| වැඩසටහන | ක්‍රියාකාරකම් | පුහුණු සංඛ්‍යාව | ප්‍රතිලාභීන් | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පංචකර්ම ප්‍රතිකාර ක්‍රම | කුසලතා පුහුණු | 01 | - එම - | 22 |
| | හස්තසාර භග්න පුහුණු | 02 | - එම - | 30 |
| යෝග පුහුණුව | පියවර 01<br>පියවර 02 | 02 | - එම - | 33 |
| ප්‍රථමාධාර | | 01 | - එම - | 91 |
| ඖෂධ සකස් කිරීම | ගුණාත්මක ඖෂධ නිෂ්පාදනය | 01 | - එම - | 23 |
| | යුනානි ඖෂධ භාවිතා කිරීමේ වැඩමුළුව | 01 | - එම - | 150 |
| | පුද්ගලික ආයුර්වේද බෙහෙත් වෙළෙඳසැල් නියාමනය කිරීමේ වැඩමුළුව | 01 | බෙහෙත් වෙළෙඳසැල් හිමිකරුවන් | 21 (යාපනය දිස්ත්‍රික්කය) |
| ඵලදායීතාවය | ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම | 07 | වෛද්‍ය නිලධාරී<br>කළමනාකරණ සහකාර | 190<br>170 |
| | ආයතනික පාලනය | 02 | වෛද්‍ය නිලධාරී | 44 |
| | වෛද්‍ය වෘත්තීය සහ නීතිමය වගකීම් | 03 | වෛද්‍ය නිලධාරී | 108 |
| ඖෂධීය ශාක | ඖෂධ හඳුනාගැනීමේ පුහුණුව | 01 | හල්දුම්මුල්ල කලාපයේ පාසැල් සිසුන් හා ගුරුවරුන් | 52 |
| | අධ්‍යාපනික ක්ෂේත්‍ර චාරිකා | 01 | ආයුර්වේද සංරක්ෂණ සභා (කැළණිය හා තඹුත්තේගම) | 34 |
| | | 03 | වෛද්‍ය නිලධාරී | 78 |
| | | 02 | ආයුර්වේද ශාස්ත්‍රී සිසුන් | 55 |
| | | 01 | වැව්ලි සංගම් - ගම්පහ | 30 |
| | | 01 | පාසැල් සිසුන් - අලවතුපිටිය | 29 |
| පුහුණුකරුවන් පුහුණු කිරීම | බාහිර ප්‍රතිකාර ක්‍රමවේද | 01 | වෛද්‍ය නිලධාරී (දෙමළ මාධ්‍ය) | 27 |
| | මාතෘ සහ ළමාරෝග | 01 | ප්‍රජා වෛද්‍ය නිලධාරී | 150 |
| | බෝවන රෝග | 01 | - එම - | 263 |
| | ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධනය | 01 | - එම - | 188 |
| සේවාරම්භක පුහුණු වැඩසටහන් | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමට ප්‍රථම දැනුවත් කිරීමේ වැඩසටහන | 03 | පාරම්පරික වෛද්‍යවරු (දෙමළ සහ සිංහල) | 130 |
| | කුසලතා සංවර්ධනය | 02 | සේවාස්ථ පුහුනු වෛද්‍ය | 106 |
| ඇගයීමේ වැඩසටහන් | සේවා අගැයීම් | 02 | - එම - | 41 |
| සේවාස්ථ පුහුණු | කුසලතා සංවර්ධනය | 02 | ආයුර්වේද හෙද/ හෙදි<br>සුළු සේවක | 20<br>54 |
| වැඩමුළු | නක්ෂත්‍ර සහ ශාන්ති කර්ම | 01 | පාරම්පරික වෛද්‍යවරු | 38 |
| | ඇස් රෝග | 01 | - එම - | 15 |
| පාරම්පරික වෛද්‍යවරු සඳහා පුහුණුව | නව තාක්ෂණය හඳුන්වා දීම | 01 | - එම - | 54 |
| | ආතරයිටීස් රෝගය හඳුනා ගැනීම | 01 | - එම - | 80 |
| | බෝ නොවන රෝග පාලනය | 01 | - එම - | 40 |
| වැඩමුළු | පාඨමාලා විමර්ශණය | 01 | ආයුර්වේද ශාස්ත්‍රී | 75 |
| | කැඩුම් බිඳුම් | 01 | පාරම්පරික වෛද්‍යවරු | 13 |
| සරෝදිනී | රෝග පාලනය | 01 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල සිසුන් | 100 |

| වැඩසටහන | ක්‍රියාකාරකම් | පුහුණු සංඛ්‍යාව | ප්‍රතිලාභීන් | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | 01 | අම්පාර දිස්ත්‍රික්කයේ පාසැල් සිසුන් | 226 |
| ප්‍රදර්ශන | දැයට කිරුළ | | දෙස් විදෙස් ජනතාව | |
| | ආයුර්වේද එක්ස්පෝ - 2013 | | | |
| | ගැහැණු ළමයා සහ දරුවා සඳහා ජාත්‍යන්තර දිනය | | පාසැල් සිසුන් | 150 |
| සහතික පත්‍ර පාඨමාලා | නක්ෂත්‍ර සහ ශාන්ති කර්ම(සති අන්ත - මාස 06) | 01 | වෛද්‍ය නිලධාරී | 50 |
| | උපස්ථායක පුහුණුව (මාස 03) | 02 | වෛද්‍ය සහායක කාර්ය මණ්ඩලය | 41 |
| පුහුණු උපකරණ සැදීමේ වැඩමුළුව | පෝස්ටර් හා අත්පත්‍රිකා | 03 | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ වෛද්‍ය නිලධාරීන් | 12 |
| පුහුණු ආයතනය සමඟ සිදු කරනු ලබන පුහුණු | හෙද පුහුණු පාසැල - රාගම | කණ්ඩායම් 03 | | 112 |
| | භෙසජ්ජක පුහුණු - දේශීය වෛද්‍ය ආයතනය | 01 | | 15 |

## (6) ආයුර්වේද ඖෂු උයන්

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මහජනතාව තුළ ප්‍රචලිත කිරිමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන වන ආයුර්වේද දෙපාර්තමේන්තුව ද දිවයිනේ විවිධ ප්‍රදේශවල විවිධ පාරිසරික කලාප නියෝජයය වන පරිදි ඖෂු උයන් පිහිටුවිම 1964 වසරේදී ආරම්භ කරන ලදි.

දෙපාර්තමේන්තුව මගින් දැනට ආරම්භ කර ඇති ඖෂු උයන් ගණන 6කි.

1. නාවින්න - බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය ඖෂු උයන
2. ගිරාදුරුකෝට්ටේ - රත් නිටුල ඖෂු උයන
3. පට්ටිපොල - කඳුලැසිය ඖෂු උයන
4. පල්ලේකැලේ - ජාතික පර්යේෂණ උද්‍යානය
5. හල්දුම්මුල්ල - මලිත ඖෂු උයන
6. පින්නදූව

ඖෂු උයන් මගින් ඉටු කරනු ලබන කාර්යයන්

- පාසැල්, විහාරස්ථාන සහ අනෙකුත් රාජ්‍ය ආයතන තුළ ඖෂු උයන් පිහිටු වීමේදි ඖෂධ පැල හා උපදෙස් ලබා දීම
- ඖෂු උයන් තුල පැල අලෙවි කිරිම
- පාසැල් සහ අනෙකුත් පාර්ශවයන් සඳහා ඖෂු පැල හඳුනා ගැනිම, වගාව සහ සංරක්ෂණ පිළිබඳව දැනුම ලබා දෙන මධ්‍යස්ථාන පැවතීම

## (I) හල්දුම්මුල්ල ඔසු උයන








ආරම්භය - 1984

දිස්ත්‍රික්කය - බදුල්ල

භූමි ප්‍රමාණය - අක්කර 65

වැඩමුළු සඳහා දේශනශාලාවක්, සංචාරක නිවාසයක් සහ නේවාසිකාගාරයක් ඔසු උයන තුළ පිහිටා ඇත.

| වැඩසටහන් | ප්‍රගතිය |
|---|---|
| පාසැල් වැඩසටහන් හා දැනුවත් කිරිමේ වැඩසටහන් | පාසැල් ගණන - 19, වෛද්‍ය විද්‍යාල-12, පරිසර හා වෙනත් සංවිධාන - 20<br>අධ්‍යයන කටයුතු සඳහා පැමිණි සංඛ්‍යාව 355, දේශීය සංචාරකයින් 150 විදේශීය සංචාරකයින් -50 |
| අක්කර 4 වගා නොකළ ඉඩම සංවර්ධනය කිරිම | අක්කර 4 ප්‍රමාණයෙන් අක්කර 2ක් සුද්ධ පවිත්‍ර කර පැළ සිටුවා නඩත්තු කර ඇත.සිටුවා ඇති පැළ ගණන - 1467 |
| ආයතනයේ පැළ වර්ග සංඛ්‍යාව වැඩි කිරිම | නිෂ්පාදිත පැළ සංඛ්‍යාව -44585<br>අලෙවි කරන ලද පැළ සංඛ්‍යාව - 22464, එහි ආදායම - රු. 831990/-<br>නොමිලේ නිකුත් කළ පැළ සංඛ්‍යාව -777, එහි වටිනාකම - රු. 52848 |
| නැතිවීමේ තර්ජනයට මුහුන පා සිටින ඖෂධ ශාක එක්රැස් කිරිම | -තණහලු - වල් කුරුඳු - එක්පෙති පියන් - වල්ලපට්ටා - දියමී - හිං කබරොස්ස - මිරිය - කුඩුම් බෙරිය - මැඩහගු - වේලා |
| බිං කොහොඹ පැළ සංඛ්‍යාව වැඩි කිරිම | නිපදවා ඇති පැළ සංඛ්‍යාව - 1714 |



## (II) පල්ලේකැලේ ඔසු උයන

| මුදලට නිකුත් කළ පැළ ප්‍රමාණය | වටිනාකම (රු) | නොමිලේ නිකුත් කළ පැළ ප්‍රමාණය | වටිනාකම (රු) |
|---|---|---|---|
| 3961 | 184535 | 3195 | 323515 |

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| ඔසු උයන පැළ 25000 දක්වා වැඩිකිරිම | ඔසු පැළ 23240 දක්වා වැඩි කර ගැනිම |
| සුදු හඳුන් පැළ 3000ක් සැකසීම | සුදු හඳුන් පැළ 2250ක් නිෂ්පාදනය කිරිම |
| පාසැල්, විහාරස්ථාන රජයේ ආයතනවල ඔසු උයන් ඇති කිරිම | පාසැල් හා විහාරස්ථාන 58ක ඔසු උයන් පිහිටුවීම |
| ඔසු ගෙවතු වගා ඇති කිරිම | ඔසු ගෙවතු 71ක් සඳහා සහ දිවිනැගුම ගෙවතු වගා සඳහා උපදෙස් හා පැළ ලබා දීම. |

## (III) පට්ටිපොළ ඔසු උයන





- සංචාරක නිවාසයේ ලැගුම් ගන්නා පුද්ගලයින්ගේ ආහාර අවශ්‍යතාවය සැපයීම සඳහා සංචාරක නිවාසය අසල පර්.40ක එළවළු සහ පලා වර්ග වගා කිරිම
- අක්කර 3ක කැරට්, බීට්, ගෝවා, රාබු, බෝංචි, අල, අතුගෝවා සහ වෙනත් පලා වර්ග වගා කිරිම (කාබනික/අකාබනික)
- විවිධ අලංකාර මල් වැවිම, රුට් බෝල් ගස් සිටුවීම සහ ආරුක්කු හා වෙනත් හැඩතල වලට ශාක සැපයීම, ඖෂධීය ශාක ඇතුළත් ප්‍රදර්ශන පාත්ති සැකසීම
- ශාක ප්‍රචාරණය, අස්වනු නෙළිම, හා වෙනත් වගා කටයුතු පිළිබඳව දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම

## (IV) ගිරාදුරුකෝට්ටේ ඔසු උයන

| ඉලක්කය | ලබා ඇති ප්‍රගතිය පිළිබඳ විස්තර |
|---|---|
| 2013 වසර තුළ පැළ 50,000ක් නිෂ්පාදනය කිරිම | දිවිනැගුම වැඩසටහන සඳහා අපේක්ෂිත පැළ මිලදී නොගත් බැවින් පැළ 15000ක් පමණක් නිපදවා ඇත. |
| | 2012/13 මහ කන්නය සඳහා අක්කර 3.75ක් වගා කර ඇත.<br>වී අස්වැන්නෙන් සහල් ලෙස 475 Kg ක් ලබා ගැනිම<br>2013/14 මහකන්නය සඳහා අක්කර 4ක් වගා කර වී අස්වැන්නෙන් සහල් ලෙස 2648 Kg ක් ලබා ගැනිම |
| වී වගාව<br>2012/13 මහ<br>2013/14 මහ | කළු හීනැටි වී ප්‍රභේදය බීජ අවශ්‍යතාවය සඳහා 01 Kg ක් වපුරා 40 Kg ක් නිපදවා ඇත. එම බීජ 2014/15 මහ කන්නයේදි වගා කිරිමට අපේක්ෂිතය. |
| නව වගා ඇති කිරිම | අක්කපාන, රත්නිටොල්, කෝමාරිකා, කප්පරවල්ලිය, හාතවාරිය, දෙහි ආදිය මව් වගාවන්/ප්‍රදර්ශන වගාවන් ලෙස පර්.20 පමණ වූ බිම් කොටස්වල පිහිටුවා ඇත. |

2013/14 මහ කන්නයේ උද්‍යානයේ මුං ඇට සිටුවා (අක්කර 1/2) මුං බීජ 79 Kg පමණ නිපදවන ලදි.
දිවි නැගුම වැඩසටහන යටතේ පැළ ගෘහ 3ක් ඉදිකරන ලදී.
පානීය ජල අවශ්‍යතාවයට හා භෝග වලට දැමීමට නළ ළිදක් ඉදිකිරීමට මූලික කටයුතු කරන ලදි.

## (V) පින්නදූව ඔසු උයන



- වාර්ෂික පැළ නිෂ්පාදනය -39,693
- අලෙවි කළ පැළ ගණන -පැල 3,969
- පැළ අලෙවි ආදායම -රු. 229,943
- නොමිලේ නිකුත් කළ පැළ ගණන - 9,958
- නොමිලේ නිකුත් කළ පැළ වල වටිනාකම -රු 422,975

# (7) ආයුර්වේද වෛද්‍ය සභාව

1961 අංක 31 දරණ ආයුර්වේද පනත අනුව ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාව ආයුර්වේද වෛද්‍යවරු ඇතුළු එම ක්ෂේත්‍රයට අදාළ පිරිස් සම්බන්ධව කටයුතු කිරීම හා ආයුර්වේද ක්ෂේත්‍රයේ ආයතනික සේවාවන් සහා උපදෙස් දීම, මග පෙන්වීම හා විනය පැවැත්මක් ඇති කිරීම සහා ක්‍රියා කරන්නා වූ සම්භාවනීය මණ්ඩලයක් වශයෙන් ක්‍රියාත්මක වේ.ආයුර්වේද විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් වෛද්‍ය සභාවට සාමාජිකයන් පත් කරනු ලබන අතර ඔවුන්ගේ නිල කාලය වසර තුනකි. ආයුර්වේද කොමසාරිස් නිල බලයෙන් මෙහි සභාපති වනු ඇත.

**කාර්යභාරය**

ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යයභාරය වනුයේ ආයුර්වේද වෛද්‍යවරුන්, ඖෂධ සංයෝජකයින්, සාත්තු සේවකයින් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි කිරීම අවලංගු කිරීම හෝ අත්හිටුවීම, වෘත්තීය හැසිරීම් විධිමත් කිරීම හා පාලනය කිරීම යනාදියයි.

මූල්‍ය ප්‍රතිපාදන: 2013 වර්ෂය සඳහා රජය මගින්රු.මි 5ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. එම වසරේ උපයා ගත් ආදායම රු.මි 4.4 ක් වන අතර මුළු වියදම රු.මි 8.4කි.

**2013 වසරේ ප්‍රගතිය**

- පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණ වලට සහභාගී වූ අයදුම්කරුවන්ගෙන් සමත්වීමේ ප්‍රතිශතය 5% ක් විය.
- විභාග පාලක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කිරීම සඳහා ලිඛිත පරීක්ෂණයක් 2013/10/05-06 දිනවල නුගේගොඩ අනුලා විද්‍යාලයේදී පවත්වන ලදී.මේ සඳහන් අයදුම්කරුවන් සංඛ්‍යාව 373ක් වූ අතර, ලිඛිත පරීක්ෂණයට සහභාගී වූයේ 293කි.

- 2013 වර්ෂය තුළ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරුන් 348කින් 39% ක් පාරම්පරික (සර්වාංග හා විශේෂ) වෛද්‍යවරුන් වේ.
- හස්ති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමට 2013-11-28 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් වෛද්‍යවරු 5 දෙනෙකු සමත් වී ඇත.
- ඉහත කර්තව්‍යන්ට අමතරව " හෙළ වෙද රුවනාර "වැඩසටහන් 2ක් මෙම වර්ෂයේ අම්පාර සහ රත්නපුර දිස්ත්‍රික්ක වල පවත්වා ඇති අතර, ආයුර්වේද හා පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කිරීමේ ජංගම සේවාව , වෘත්තීය හා සංවර්ධන වැඩසටහන් සහ හෙළ වෙද රැකවරණ විශ්‍රාම වැටුප් ක්‍රමයද ක්‍රියාත්මක විය.
- ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සියළු වෛද්‍යවරුන්ගේ තොරතුරු එහි නිල වෙබ් අඩවිය වන www.ayurvedicmedicoun.gov.lk හරහා අන්තර්ජාලයට මුදා හැර ඇත.

## 8.2 ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පණත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ ඇති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපනය කරනලදී. මෙය ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ. උසස් හා නියමිත ප්‍රමිතියෙන් යුතු ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරිම හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයට ඖෂධ බෙදාහැරිම මෙහි ප්‍රධාන කාර්යයන් වේ.



ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අලෙවි සැල, නාවින්න

**දැක්ම**

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශිය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතින්ගෙන් යුතුව සපුරාලන සේවය මුල්කරගත් පුරෝගාමී ආයතනයක් වීම.

**මෙහෙවර**

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරිම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරා ලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරිම සහ සමාජ සුභසාධනය ඉටුකරලමින් සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරිම.

**සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණු:**

01. ආයුර්වේද ඖෂධ වර්ග හෛසජ්ජක ද්‍රව්‍යහා සකස් කළ ආයුර්වේද ඖෂධ උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව නිෂ්පාදනය කිරිම.
02. රාජ්‍ය පළාත් සභා සහ ප්‍රාදේශිය සභා වලට ඖෂධ අවශ්‍යතා මුළුමනින්ම සපුරාලන අතර තරගකාරි ආයුර්වේද ඖෂධ වෙළඳපොළට ප්‍රධාන සැපයුම්කරුවීම.

03. ඖෂධ නිෂ්පාදනයෙහිලා අත්‍යාවශ්‍ය ආයුර්වේද සිද්ධ, යුනානි, අමු ඖෂධ වර්ග ආනයනය කිරිම හා දේශිය වෙළඳපොළ අවශ්‍යතා වලට අලෙවි කිරිම.

04. දේශියව නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග(ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය) යාවත්කාලීන කරනු ලබන සහතික මිළ ක්‍රමයක් යටතේ මිලදී ගෙන ගබඩාගත කර සාධාරණ මිලකට අලෙවි කිරිම සහ නිෂ්පාදන ගොවීන්ට සුරක්ෂිතභාවයක් හා උපරිම මිලක් ලබා ගැනිම.

05. ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන ඖෂධ පැළෑටි සංරක්ෂණය කිරිම සහ වගාවන් ව්‍යාප්ත කිරිම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.

06. ඖෂධ නිෂ්පාදනය ගුණාත්මකභාවය වර්ධනය සඳහා ආයුර්වේද ඖෂධ පිළිබඳ ශාස්ත්‍රීය සහ භෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරිම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරිම.

07. ආයුර්වේද ඖෂධාගාර පවත්වා ගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වර්ග නිපදවීම

08. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය තහනම් ඖෂධ සහ පුපුරන ද්‍රව්‍ය ඖෂධ නීත්‍යානුකූලව ලබා ගෙන ඖෂධ නිෂ්පාදනය කරනු ලබන වෛද්‍යවරුන්ට නිත්‍යානුකූලව දීම මගින් පාරම්පරික වෛද්‍ය ක්‍රම රැක ගැනිමට ක්‍රියා කිරිම.

**ආයතනික ව්‍යුහය:**

- නිෂ්පාදනාගාර අංශය
- සැපයුම් අංශය
- නිෂ්පාදන අංශය
- අලෙවි අංශය
- සැළසුම් අංශය
- මානව සම්පත් අංශය
- මූල්‍ය අංශය
- අභ්‍යන්තර විගණක අංශය

**අලෙවිසැල් හා වෛද්‍ය සායන පවත්වා ගෙන යන ස්ථාන:**

- නාවින්න අලෙවි මධ්‍යස්ථානය
- විජේරාම අලෙවි මධ්‍යස්ථානය හා සායන
- මහනුවර අලෙවි මධ්‍යස්ථානය හා සායන
- රත්නපුර අලෙවි මධ්‍යස්ථානය හා සායන
- ගාල්ල අලෙවි මධ්‍යස්ථානය හා සායන
- අනුරාධපුර අලෙවි මධ්‍යස්ථානය
- තංගල්ල අලෙවි මධ්‍යස්ථානය
- වේරහැර මෝටර්රථ දෙපාර්තමේන්තුවේ අලෙවි මධ්‍යස්ථානය
- දියතලාව අලෙවි මධ්‍යස්ථානය
- සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය
- ඉසුරුපාය අලෙවි මධ්‍යස්ථානය
- බදුල්ල අලෙවිමධ්‍යස්ථානය
- මොණරාගල අලෙවි මධ්‍යස්ථානය
- යාපනය අලෙවි මධ්‍යස්ථානය
- බැස්ටියන් මාවතේ අලෙවි මධ්‍යස්ථානය

<u>සංවර්ධන වැඩ සටහන්වල ප්‍රගතිය</u>

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය නියමිත ප්‍රමිතියකින් නිෂ්පාදනය කර රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත සාධාරන මිලකට බෙදා හැරේ. අමුද්‍රව්‍ය එක්රැස් කිරිම හා ප්‍රවාහනය සඳහා විවිධ බාධා ඇත. රජයේ වනාන්තර වලින් ලබා ගන්නා බිංකොහොඹ, කොල්ලන්කොළ, නිකකොළ, අරළු, බුළු, නෙල්ලි වැනි

ඖෂධ ලබාගැනීමේදී අදාළ ආයතන අනුමැතින් ලබා ගැනීමේ දුෂ්කරතා ඇති අතර ගංජා වැනි ඖෂධ තහනම් පැලැටි ලෙස ප්‍රකාශිත නිසා ඖෂධ නිෂ්පානයට අහිතකර බලපෑම් සිදුවී ඇත. දැනට අධිකරණය භාරයට පත්වන ඖෂධ සංස්ථාවට ලබා ගැනීමට කටයුතු කෙරේ. අමුද්‍රව්‍ය ආනයනයේදි ගැටළු රැසක් පැනනැගී ඇත.

2013 වර්ෂයේදි ඖෂධ වර්ග 150ක් නිෂ්පාදනය කර ඇති අතර නිෂ්පාදන වටිනාකම රු. 282,379,808.55 කි. ඖෂධ බෙදාහැරිම සදහා දිවයින පුරා අලෙවි නියෝජිතයින් පත්කර ඇති අතර ඔවුන් මඟින් ඖෂධ බෙදාහැරිම හා අලෙවිය සිදුවේ. 2013 අවසාන වන විට පත්කර ඇති අලෙවි නියෝජිතයින් සංඛ්‍යාව 15කි. ඖෂධ නිෂ්පාදන රාජ්‍ය අවශ්‍යතාවය සපුරනු ලබන අතර, පෞද්ගලික අංශයට නිෂ්පාදනයන්ගෙන් 20% ක් පමණ ප්‍රමාණයක් අලෙවි කරනු ලබයි. 2013 වර්ෂයේ අලෙවි ආදායම රු. 425,450,179.00කි.

**ඉදිකිරිම් කටයුතු:**

**නව සිව්මහල් ගබඩා සංකර්ණය-**

වැඩිවන ඖෂධ ඉල්ලුමට සරිලන නිෂ්පාදනය සිදු කිරිමට සංස්ථාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවිම නිසා අමුද්‍රව්‍ය හා නිමි ඖෂධ එක්රැස්කර ගබඩා ගත කිරිම සදහා මුළු ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 100ක් වන සිව්මහල් ගබඩා සංකීර්ණයක් ඉදිකිරිම් 2012 වර්ෂයේදි ආරම්භ කරන ලදී, මේ වන විට 70 % ක පමණ ඉදිකිරීම් ප්‍රගතියක් පෙන්වන මෙම ගොඩනැගිල්ල සඳහා 2013 වර්ෂය අග වන විට ලැබි ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.53කි.

**ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය නවීන යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම:**

ඉහල ගුණාත්මයකින් යුතු නව නිෂ්පාදන වෙළඳපල ඉල්ලුමට සරිලන සේ නිපදවීම සඳහා 2013 වර්ෂයේදී උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 4.1ක ප්‍රතිපාදන ලබා දී තිබිණි. මෙමඟින් ඖෂධ කුඩු කිරීමට අවශ්‍ය යන්ත්‍ර (Disintegrators) 02ක් මිලදී ගෙන ඇති අතර, නිෂ්පාදනාගාරයේ ඵලදායීතාව ඉහල නැංවීම සඳහා විදුලියෙන් බඩු ඔසවන යන්ත්‍ර (Electric Hoists) 04ක් මිලදී ගෙන ඇත.

## 8.3 හෝමියෝපති රෝහල / වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය ක්‍රම සංවර්ධනය යටතේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් වැලිසර රජයේ හෝමියෝපති රෝහල හා හෝමියෝපති වෛද්‍ය සභාව පාලනය වේ. දේශීය වෛද්‍ය ක්‍රමයට සමගාමීව දියුණු කල හැකි වෛද්‍ය ක්‍රමයක් වන මෙහි උන්නතිය වෙනුවෙන් හෝමියෝපති වෛද්‍ය සභාව හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය එක්ව බොහෝ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. ඒ අතර, නව හෝමියෝපති පනතක් සැකසීම, නව බඳවාගැනීමේ පටිපාටි සැකසීම යනාදිය ප්‍රමුඛ වේ. තවද, ජංගම සායන පවත්වමින් රෝගීන්ට නොමිලේ ප්‍රතිකාර කිරීම, ජනතාව දැනුවත් කිරීම, උපදේශන සේවා සැපයීම යනාදියද ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන්ම හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීමේ අරමුණින් ඉන්දීය රජය

මහින්ද වාර්ෂිකව වෛද්‍ය උපාධි ශිෂ්‍යත්ව පිරිනමන අතර 2013 වර්ෂයේදී ඒ සඳහා ශිෂ්‍යත්වලාභීන් දසදෙනෙකු තෝරාගෙන ඇති අතර ඔවුන් ඉන්දියාවේ පුහුණුව ලබමින් සිටියි.

## හෝමියෝපති රෝහල :



බාහිර රෝගීන් සඳහා හෝමියෝපති ඖෂධ නිකුත් කිරීම

**දැක්ම**

ශ්‍රී ලාංකීය සමස්ත ජනතාවගේ සංවර්ධනයට දායක විය හැකි සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිකිරීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සියළුම ජනතාවට අඩුම වියදමකින් යුතුව රෝග සමනය හා රෝග වළක්වා ගැනීමට පහසු හා ලාභදායක වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා වැලිසර හෝමියෝපති රෝහල මඟින් ක්‍රියාකාරී වැඩසටහනක් ජනතාව අතරට ගෙනයාම.

හෝමියෝපති වෛද්‍ය විද්‍යාවේ පියා ජර්මන් ජාතික සැමුවෙල් හානිමාන් නැමති වෛද්‍යවරයා විසින් අරඹන ලද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය, පවත්වාගෙන යාම හා ප්‍රචලිත කිරීමේ ප්‍රධාන ආයතනය වන්නේ 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ ස්ථාපිත කරන ලද වැලිසර අංක 94 දරණ ස්ථානයේ පිහිටි හෝමියෝපති වෛද්‍ය සභාව වේ. ඒ සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රථම හා එකම රෝහල වැලිසර පිහිටි රජයේ හෝමියෝපති රෝහලයි. ලාභදායී, අතුරු ආබාධවලින් තොර, ආරක්ෂාකාරී, ස්වභාවික අමුද්‍රව්‍ය වලින් නිෂ්පාදිත හෝමියෝපති ඖෂධ සියළුම රෝගී තත්ව සඳහා ප්‍රතිකාර වශයෙන් යොදා ගන්නා අතර සන්ධි ආබාධ, ශ්වසන රෝග, ළමා හා කාන්තා රෝග, සෙම් රෝග සහ සමේ රෝග සඳහා වඩාත් සුදුසුවීම හේතුවෙන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය වර්තමානයේ වඩාත් ජනප්‍රිය වෙමින් පවතී.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය කෙරෙහි ජනතාවගේ නැඹුරුවීම කෙසේදයත්, 2013 වසරේදී නව සායන පිළිබඳව ප්‍රදේශ කිහිපයකින්ම ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා නව සායන ආරම්භ කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම ආදී කටයුතු සිදු කරමින් පවතී. හෝමියෝපති රෝහලේ නිලධාරීන් සඳහා රු. මිලියන 79ක වටිනාකමකින් යුත් නේවාසිකාගාර සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු 2013 ජනවාරි මස 04 වන දින ආරම්භ කරන ලදී. දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක අභ්‍යන්තර රෝගී අංශයක් පවතින වැලිසර පිහිටි හෝමියෝපති රෝහල, අභ්‍යන්තර හා බාහිර රෝගී අංශ 2කින් යුක්තව ක්‍රියාත්මක වන අතර දෛනිකව රෝගීන් 150-200 පමණ සංඛ්‍යාවකට ප්‍රතිකාර ලබාදේ.

## හෝමියෝපති වෛද්‍ය සභාව :

හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය නියාමනය, වෛද්‍යවරු ලියාපදිංචිය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම ආදිය සිදු කරනු ලබයි. 2013 වර්ෂයේ ඡන්දයෙන් පත්කර ගන්නා ලද වෛද්‍යවරුන්ගෙන් සමන්විත වෛද්‍ය සභාවක් නොමැති වීම හේතුවෙන් අතුරු පාලක

කමිටුවක් මඟින් සියළු පාලන කටයුතු සිදු කරයි. හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ රජයේ නිදහස් හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථාන 07ක් ක්‍රියාත්මක වේ. ඒවා කුරුණෑගල, මොණරාගල, පරකඩුව, මාතලේ, තෝලංගමුව, දෙහිවල, හා පාලමුනෙයි යන ස්ථානවල පිහිටා ඇත.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රතිපාදන යටතේ ආයතනික කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. 2013 වසරේ නව හෝමියෝපති වෛද්‍යවරු/ වෛද්‍යවරියන් 05 දෙනෙකු 2013/08/07 දින ලියාපදිංචි කර ඇත. තවද හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා වෛද්‍යවරුන් ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් 14කට අනුමැතිය ලබාදී ඇති අතර, නව හෝමියෝපති ඖෂධ 03ක් නිෂ්පාදනය සඳහා වෛද්‍ය සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. හෝමියෝපති රෝහල හා එක්ව 2013 වසර තුල ජංගම සායන 13ක් පවත්වා ඇති අතර එමඟින් 1300කට අධික රෝගීන් සංඛ්‍යාවකට ප්‍රතිකාර සිදුකර ඇත.